නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යංශය

திறன் அபிவிருத்தி, தொழிற்சார் கல்வி, ஆராய்ச்சி மற்றும் புதிய கண்டுபிடிப்புக்கள் இராஜாங்க அமைச்சு

State Ministry of Skill Development Vocational Education Research and Innovation

# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report 2021





ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

இலங்கை தொழிற்பயிற்சி அதிகாரசபை

Vocational Training Authority of Sri Lanka




| | | |
|---|---|---|
| **ආයතනය** | - | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය |
| **අමාත්‍යාංශය** | - | නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යංශය |
| **ලිපිනය** | - | "නිපුණතා පියස"<br>නො 354/2,<br>ඇල්විටිගල මාවත,<br>නාරාහේන්පිට,<br>කොළඹ 05. |
| **ඊ මේල් ලිපිනය** | - | info@vtasl.gov.lk |
| **වෙබ් අඩවිය** | - | www.vtasl.gov.lk |
| **විගණකවරු** | - | විගණකාධිපති<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| **බැංකුකරුවන්** | - | මහජන බැංකුව |

# පටුන


| | |
|---|---|
| දැක්ම හා මෙහෙවර | 5 |
| කාර්යයන් | 6 |
| පිළිගැන්වීම | 7 |
| හැඳින්වීම හා ව්‍යුහය | 9 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 9 |
| 2021 වසරේ ජයග්‍රහණයන් | 11-12 |
| 2022 වර්ෂය සඳහා වැඩසටහන් හා ඉලක්ක | 13-14 |
| ඉහළ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යය මණ්ඩලය | 15-17 |
| කාර්යය මණ්ඩල සංයුතිය | 18-21 |
| වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම | 22-24 |
| පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය | 25-27 |
| වෘත්තීය පුහුණු පරීක්ෂණ පැවැත්වීම හා ඇගයීම් | 28 |
| වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය | 29 |
| රැකියාගත කිරීම | 30-32 |
| රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා එක්ව සිදුකල වැඩසටහන් | 33 |
| ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 34 |
| අභියෝග | 34 |
| විගණනය හා කළමනාකරණ කමිටුව | 35 |
| මුල්‍ය ප්‍රකාශන වාර්තාව | 36-65 |
| විගණකාධිපති වාර්තාව | 66-73 |
| විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු වාර්තාව | 74-75 |

# දැක්ම

ගෝලීය රැකියා වෙළෙඳපොල අවශ්‍යතා සපුරාලන
ශ්‍රී ලංකාවේ ක්‍රියාශීලී හා නිර්මාණශීලී වෘත්තීය පුහුණුව සපයන
ප්‍රමුඛතම ආයතනය වීම

# මෙහෙවර

වෘත්තීය පුහුණු හා අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි නවීන ක්‍රමවේදයන් හා
තාක්ෂණයන් මගින් පුද්ගලයන් තුල නිපුණත්වයන් සංවර්ධනය කරමින්
ගෝලීය පුහුණු ශ්‍රම ඉල්ලුම සපුරාලීම පිණිස පහසුකම් සැලසීම.

අපගේ සේවාවන් හා පහසුකම් ඉහලම ප්‍රමිතියක
තබා ගනිමින් හා ජාත්‍යන්තර රැකියා ප්‍රවණතාවයන්
ඉලක්ක කර ගනිමින් අපි මෙම
මෙහෙවර සාක්ෂාත් කර ගන්නෙමු.

# කාර්යයන්

- වෘත්තීය පුහුණු වැඩසටහන් සකස් කිරීම හා රැකියා ගතවීම සඳහා අවශ්‍ය දක්ෂතා ලබාගත හැකිවන පරිදි සුදුසුකම් ඇති තරුණ තරුණියන්ට අවශ්‍ය වෘත්තීය පුහුණුවක් කෙලින්ම හෝ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ නියෝජ්‍ය ආයතනයක් මගින් ලබාදීම.

- ජාතික වෘත්තීය පරීක්ෂණ, විභාග පැවැත්වීම සහ වෘත්තීය පුහුණුව ලබා ඇති ආධුනිකයන්ට සහතික සහ වෙනත් ප්‍රධාන නිකුත් කිරීම.

- වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ පැවත්වීම හා වෘත්තීය පුහුණුව සංවර්ධනය කිරීම.

- වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වල නිසි ප්‍රමිති පවත්වාගෙන යාම සඳහා එම මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය කිරීම.

- අධිකාරිය විසින් වෘත්තීය පුහුණුව සඳහා සපයන ලද පහසුකම් සහ උපකරණ වෙනුවෙන් ගාස්තු හෝ වෙනත් අයකිරීම් නියම කිරීම සහ අය කිරීම.

- අධිකාරියේ කටයුතු සඳහා අවශ්‍ය යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීම,දැරීම, බද්දට ගැනීම හෝ දීම, උකස් කිරීම, කුලියට ගැනීම හෝ බැහැර කිරීම.

- අධිකාරියේ පුහුණුව ලබන ආධුනිකයින් සහ සේවකයින් සඳහා මුදල් අධාර සහ සුබසාධන පහසුකම් සැපයීම.

- අධිකාරියේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි සියළුම ගිවිසුම් වලට එලඹීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.

- අධිකාරිය විසින් වෘත්තීය පුහුණුව සදහා තෝරා ගනු ලැබූ ආධුනිකයින්ට වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා සේවා යෝජකයින් සමග ගිවිසුම් වලට එලඹීම.

- අධිකාරියේ ආධුනිකයින්ට වෘත්තීය පුහුණුව ලබා දීමට අදහස් කරනු ලබන සෑම සේවා යෝජකයකුම එම පුහුණුවට ප්‍රථම ආධුනිකයා සමග ගිවිසුමකට එලඹීය යුතු බවට සහ එම ගිවිසුම අධිකාරිය වෙත ලියාපදිංචි කරන බවට වග බලා ගැනීම.

- වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා උපදේශනය ලබාදීම.

# පිළිගැන්වීම

ගරු ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා,
අධ්‍යාපන අමාත්‍ය,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

ගරු ඇමතිතුමනි,

<u>වාර්ෂික වාර්තාව - 2021</u>
<u>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය</u>

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරි පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව 2021 වර්ෂයේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙයට ,
විශ්වාසී ,



එයාර් වයිස් මාෂර්ල් ප්‍රසන්න රණසිංහ (විශ්‍රාමික)
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

# හැඳින්වීම හා ව්‍යුහය

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනත යටතේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය ස්ථාපිත කරන ලදී.

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනතේ 5 වන වගන්තියට අනුව පත් කරනු ලබන සභාපතිවරයකු, උප සභාපතිවරයකු, ඇතුළු සාමාජිකයින් 12 දෙනෙකුගෙන් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පාලක මණ්ඩලය සමන්විත වේ.

## අධ්‍යක්ෂ මණ්ඩලය ( 2021.04.08 සිට 2021.12.31 දක්වා )

- **එරංග බස්නායක මහතා**
  සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

- **මහේෂ් ආරියරත්න මහතා**
  උප සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

- **තරංග නලීන් ගම්ලත් මහතා**
  සභාපති
  ජාතික ආධුනිකත්ව හා කාර්මික
  පුහුණු අධිකාරිය

- **ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා**
  කම්කරු කොමසාරිස් ජනරාල්
  කම්කරු දෙපාර්තුමේන්තුව

- **ටී.එම්.ජේ. බණ්ඩාර මහතා**
  අධ්‍යක්ෂ
  මුදල් ආර්ථික කටයුතු හා ප්‍රතිපත්ති සංවර්ධන
  අමාත්‍යාංශය

- **සමන් වඩුගේ මහතා**
  අතිරේක ලේකම්
  ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

- **වින්දික පියරත්න මහතා**
  අධ්‍යක්ෂ
  කාර්මික සංවර්ධන කර්මාන්ත හා සැපයුම්දාම
  කළමනාකරණ අමාත්‍යාංශය

- **හද්‍රා විතානගේ මිය**
  අධ්‍යක්ෂ
  අධ්‍යාපන අමාත්‍යාංශය

- **ආචාර්ය මනීෂා බර්තා කොඩිතුවක්කු මිය**

- **සජීව සුරවීර මහතා**

- **කේ ඒ එච් ඩී කේ කොල්ලුරේ මහතා**

- **පියදාස එච් මාරම්භගේ මහතා**

## අධ්‍යක්ෂ මණ්ඩලය (2021.01.01 සිට 2021.03.31 දක්වා)

- **දමිත වික්‍රමසිංහ මහතා**
  සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

- **සංජය ජයමාන්න මහතා**
  උපසභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

- **තරංග නලීන් ගම්ලත් මහතා**
  සභාපති
  ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය

- **ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා**
  කම්කරු කොමසාරිස් ජනරාල්
  කම්කරු දෙපාර්තුමේන්තුව

- **ටී එම් ජේ බණ්ඩාර මහතා**
  අධ්‍යක්ෂ
  මුදල් ආර්ථික කටයුතු හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

- **සමන් වඩුගේ මහතා**
  අතිරේක ලේකම්
  ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

- **ආර් පී රංජන් මහතා**
  කථිකාචාර්ය

- **වින්දික පියරත්න මහතා**
  අධ්‍යක්ෂ
  කාර්මික සංවර්ධන කර්මාන්ත හා සැපයුම්දාම කළමනාකරණ අමාත්‍යාංශය

- **භද්‍රා විතානගේ මිය**
  අධ්‍යක්ෂ
  අධ්‍යාපන අමාත්‍යාංශය

- **ඩබ් එම් දමිත ලොකුබණ්ඩාර මහතා**

- **යසිත් ගමගේ මහතා**

- **ස්වර්ණා නීලවල මිය**

2021 වර්ෂය තුළ දී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 07ක් පවත්වා ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනත යටතේ 1995 අගෝස්තු මස 16 වන දින ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පිහිටුවනු ලැබිය. 2021 වර්ෂයේ දී ජාතික වෘත්තීය පුහුණු ආයතන 08 ක් දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 22 ක් හා ප්‍රාදේශියව ක්‍රියාත්මක වන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 179 ක් හා ලියාපදිංචි වූ බන්ධනාගාර හා පුනරුත්ථාපන මධ්‍යාස්ථාන 04 කින් සමන්විත වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 213ක මධ්‍යස්ථාන ජාලයක් ක්‍රියාත්මක කරමින් වෘත්තීය පුහුණු වැඩසටහන් 1328 ක් පූර්ණකාලීනව හා අර්ධකාලීනව 191 ක් පවත්වා යෞවන යෞවනියන් 33416 කට තම සේවය සැපයීමට සමත් වූ මෙම ආයතනය මෙම වසරේ දී සිය 26 වන සංවත්සරය සමරනු ලැබීය.

# 2021 වසරේ ජයග්‍රහණයන්

2021 වර්ෂයේ දිවයින පුරා පිහිටි පුහුණු මධ්‍යස්ථාන 213 ක දී පූර්ණකාලීනව හා අර්ධකාලීනව වෘත්තීය පුහුණුව සඳහා තරුණ තරුණියන් 58585ක් බඳවා ගැනීමට ඉලක්ක කරනු ලැබුවද කොවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය මත 2021 වර්ෂයේ බඳවා ගැනීමට හැකි වූයේ පූර්ණකාලීනව 25089 ක් හා අර්ධකාලීනව 8327 ක් වශයෙන් 33416 කි. කොවිඩ් වසංගත තත්වය යටතේ වුවද 2021 වර්ෂයේ මාර්ගගත අධ්‍යාපන ක්‍රමවේදය උපයෝගී කර ගනිමින් දෙවන අධ්‍යයන වාරය නොවැම්බර් මස ආරම්භ කරනු ලැබීය. ප්‍රථම අර්ධයේ පාඨමාලා අවසන් කරනු ලැබුවේ 2021 දෙසැම්බර් මස වන අතර ඉතිරිය 2022 වර්ෂයේ අවසන් කිරීමට නියමිතව ඇත.

- ජාතික ශ්‍රම බලකායට නිපුණ ශිල්පීන් පුහුණු කිරීමේ ප්‍රමුඛ කාර්යය යටතේ දිවයින පුරා පිහිටි වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 213 කදී පාසල් අධ්‍යාපනය නිම කළ තරුණ තරුණියන් 25089 කට පූර්ණකාලීනව වෘත්තීය අධ්‍යාපනය ලබා දීම.

- වෘත්තිය ක්ෂේත්‍රයන්හි නියැලෙන්නන්ගේ වෘත්තීය සංවර්ධනයට හා අභිමත වෘත්තීන්ට පිවිසීමට බලාපොරොත්තු වන ආධුනිකයන් 8327 කට අර්ධකාලීන පුහුණුව ලබාදීම.

- පාඨමාලා නව්‍යකරණයට ලක් කර නව පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කිරීම.

  - Apperal Design Technician පාඨමාලා 15ක් ක්‍රියාත්මක කිරීම.
  - සංචාරක සංවර්ධන අධිකාරිය හා එක්ව සංචාරක රියදුරු පාඨමාලාව ආරම්භ කිරීම මගින් 819 දෙනෙකු පුහුණු කිරීම.
  - වැඩිහිටි රැකවරණ හා ළමා රැකවරණ පාඨමාලා ආරම්භ කිරීම.
  - මාර්ගගත අධ්‍යාපන ක්‍රමවේදය යටතේ Cyber Security Network Essential පාඨමාලා ක්‍රියාත්මක කර 5546 දෙනෙකු පුහුණු කිරීම.
  - නූතන තරුණ පරපුර උද්යෝගීමත්ව ඉදිකිරීම් ක්ෂේත්‍රයට ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් “විසල් පුහුණු” වැඩසටහනේ නියමු ව්‍යාපෘතිය ආරම්භ කර පුහුණුවන්නන් 22ක් බඳවා ගැනීම. මින් NVQ Level III මට්ටමට සුදුසුකම් ලබා පුහුණුවන්නන් 13 දෙනෙකු රැකියාගත වී ඇත.

- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික 13746 කුත් (NVQ) නොවන සහතික 3587 කුත් පෙර දැනුම ඇගයීම (RPL) යටතේ සහතික 1413 කුත් වශයෙන් සහතික 18746 ක් නිකුත් කිරීම.

- වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ පද්ධති (QIS) හා තත්ත්ව කළමනාකරණ පද්ධති (QMS) වැඩසටහන් 10ක් ක්‍රියාත්මක කිරීම හා පාඨමාලා 25ක් සඳහා ප්‍රතීතනය ලබා ගැනීම.

- 2021 වර්ෂය තුල මාර්ගගත ක්‍රමවේදයද උපයෝගී කරගනිමින් වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් 1247ක් පවත්වා පාසල් සිසුන්ල පාසල් හැරගිය සිසුන්, දෙමාපියන්, ගුරුවරුන් ඇතුළු 58463ක් දැනුවත් කිරීම.

- ඩිජිටල් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ රූපවාහිනී නාලිකාව (V TV- Youtube) මගින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) පාඨමාලා 11ක් සඳහා Video Clips 111 ක් නිෂ්පාදනය කිරීම හා Zoom තාක්ෂණය උපයෝගී කරගනිමින් වෘත්තීය පුහුණුව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 31ක් පැවැත්වීම මගින් දෙමාපියන් , පාසල් දරුවන් , ගුරුවරුන් 1290ක් දැනුවත් කිරීම.

- දිස්ත්‍රික් මට්ටමින් විශේෂ වෘත්තීය පුහුණු ප්‍රවර්ධන වැඩසටහන් දිස්ත්‍රික් 06ක (අනුරාධපුර, නුවරඑළිය , ත්‍රිකුණාමලය , ගාල්ල , මාතර හා හම්බන්තොට) පැවැත්වීම.

- වෘත්තීය පුහුණු පාඨමාලා වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හා නව තාක්ෂණය යොදාගැනීමේ අරමුණින් රාජ්‍ය හා  පෞද්ගලික අංශයේ ආයතන හා ගිවිසුම්ගත වීම.

  « අයිඩියල් මෝටර්ස් (පුද්ගලික) සමාගම සමග එක්ව ග්‍රාමීය ප්‍රදේශ වල තරුණ තරුණියන්ට මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ පුහුණු පාඨමාලා සඳහා වෘත්තීය පුහුණු අවස්ථාව ලබා දීම  සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.

  « බෙලෝස් ලංකා පුද්ගලික සමාගම සමග එක්ව ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ කොණ්ඩා සැකසුම් ශිල්පී පාඨමාලා 58 ක් සඳහා අවශ්‍ය පුහුණු ද්‍රව්‍ය ලබා දිම සහ පුහුණුලාභීන් සඳහා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

  « මහජන උපයෝගීතා කොමිෂන් සභාව සමග ශ්‍රී ලංකාවේ විදුලි කර්මාන්තයේ නියැලෙන විදුලි තාක්ෂණික ශිල්පීන්ගේ දැනුම හා කුසලතා සංවර්ධනයට අදාල පහසුකම් සලසා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

  « ළමා අරමුදල ශ්‍රී ලංකා ආයතනය සමග එක්ව ළමා සුරැකුම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

  « ලංකා විදුලි (පෞද්ගලික) සමාගම සමග එක්ව 2017 අංක 04 දරණ පනතට අනුව LECO ආයතනයේ සුදුසුකම් සම්පූර්ණ කරන ලද තාක්ෂණික නිලධාරීන් සඳහා NVQ මට්ටමේ සහතික ලබා දීමට කටයුතු කිරීම.

  « කෙවිල්ටන් පුද්ගලික සමාගම හා එක්ව ශ්‍රී ලංකාවේ විදුලි කර්මාන්තයේ නියැලෙන විදුලි තාක්ෂණික ශිල්පීන් සඳහා දැනුම හා කුසලතා සංවර්ධනයට අවශ්‍ය කටයුතු සිදුකිරීම.

  « බැරිස්ටා කොෆි ලංකා (පුද්ගලික) සමාගම සමග එක්ව එම ආයතනයේ එක් එක් ක්ෂේත්‍රයන්ගේ පුහුණුවන්නන්ගේ දැනුම හා කුසලතා සංවර්ධනය කිරීම තුලින් ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ රැකියා වෙළඳපල සඳහා නිපුණ වෘත්තිකයන් සක්‍රීය කිරීම හා අන්තර් සම්බන්ධතා ගොඩ නැගීම.

  « තල් ආශ්‍රිත නිෂ්පාදනයන්හි නිරත වන තරුණ තරුණියන් වෙත වෘත්තීය පුහුණුව ලබා දීම තුලින් තල් ආශ්‍රිත නිෂ්පාදනවල ගුණාත්මකභාවය රැක ගැනීම සඳහා තල් සංවර්ධන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹීම.

  « ඩයමන්ඩ් කටර් (පුද්ගලික) සමාගම එක්ව කුසලතාවයෙන් පිරිපුන් මැණික් කපන්නන් බිහි කිරීම සඳහා යෞවන යෞවනියන් දැනුමින් සහ කුසලතාවන්ගෙන් බල ගැන්වීම.

# 2022 වසර සඳහා වැඩසටහන් හා ඉලක්ක

1. වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර 19 ක් යටතේ ජාතික ශ්‍රම බලකායට කුසලතා පූර්ණ තරුණ පරපුරක් දායාද කිරීමේ අරමුණින් පිළිවෙලින් පූර්ණකාලීනව හා අර්ධකාලීනව 31,915 ක් හා 10,450 ක් ලෙස ආධුනිකයින් 42,365 දෙනෙකු පුහුණු කිරීම.

2. පහත වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර යටතේ පාඨමාලා ව්‍යාප්තිය වැඩිකිරීම තුලින් මාර්ගගත අධ්‍යාපනය හා ආයතනික පුහුණුව වශයෙන් මිශ්‍ර (blended) පුහුණු ක්‍රමවේදයක් අනුගමනය කර ආධුනිකයින් 4,630ක් පුහුණු කිරීමට සැලසුම් කිරීම

| | | |
|---|---|---|
| - Cyber Security | - | 2000 |
| - Computer Application Assistant (Blended) | - | 570 |
| - Child Care giver (Child Fund) | - | 15 |
| - Computer Graphic Designer | - | 275 |
| - Tourist Driver | - | 580 |
| - Tourist Driver Refresher | - | 800 |
| - Apparel Designing Technician | - | 260 |
| - Auto Mobile Mechanic | - | 40 |
| - Bathik Artist | - | 90 |

3. විධිමත් ඇගයීම් ක්‍රමවේදයන් අනුගමනය කරමින් ජාතික වෘත්තීය සුදුසුකම් NVQ සහතික 28,165ක් සහ NVQ නොවන සහතික 14,900ක් නිකුත් කිරීම.

4. වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම පුළුල් කිරීමේ අරමුණින් පළාත් මට්ටමින් අංගසම්පූර්ණ වෘත්තීය මාර්ගෝපදේශන ඒකක 10ක් පිහිටුවීම.

5. මහජන උපයෝගීතා කොමිෂන් සභාව හා එක්ව විදුලි කාර්මික ශිල්පීන් 600ක් සඳහා පෙර දැනුම ඇගයීම යටතේ සහතික ලබා දීම.

6. දිවයින පුරා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් 1,600ක් පැවැත්වීම මගින් වෘත්තීය පුහුණුව පිළිබඳව දැනුවත් කිරීම.

7. නූතන තරුණ පරපුර වෘත්තීය පුහුණුව සඳහා ආකර්ෂණය කර ගැනීමේ උපායමාර්ගික පියවරක් වශයෙන් තාක්ෂණයෙන් හා යටිතල පහසුකම් වලින් පෝෂිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම, කළුතර- බුලත්සිංහල හා ඉංගිරිය මධ්‍යස්ථානයන්හි පුහුණු කටයුතු ආරම්භ කිරීම.

8. ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් 56ක් පැවැත්වීම හා නව නිපැයුම් දිරිගැන්වීමේ ඒකක (Incubator) 2ක් පළමු පියවර වශයෙන් ස්ථාපිත කිරීම. SLASSCOM ආයතනය හා එක්ව K-tec ආයතනයේ එක් නව නිපැයුම් ඒකකයක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත.

9. රාජ්‍ය හා පෞද්ගලික සම්බන්ධතා (PPP) මත පවත්වනු ලබන ශිල්පීය දක්ෂතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන් 60ක් පැවැත්වීම.

10. වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය තුල නව ප්‍රවණතා පිළිබඳ දැනුවත් කිරීම හා කර්මාන්ත ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා හඳුනාගැනීමේ අරමුණින් කර්මාන්ත හිමියන් දැනුවත් කිරීමේ වැඩමුලු 15ක් හා රැකියා වෙළඳපොල 25ක් පැවැත්වීම.

11. රැකියා වෙළඳපොළ පැවැත්වීම හා කර්මාන්ත ලියාපදිංචි කර ගැනීම තුලින් පුහුණුව අවසන් කරන ආධුනිකයින්ට දේශීය රැකියා හා ස්වයං රැකියා අවස්ථා පිළිවෙලින් 8,500ක් හා 1,500ක් වශයෙන් රැකියා 10,000ක් ලබා දීම.

12. කාර්යය මණ්ඩල සංවර්ධනය යටතේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා මාර්ගගත ක්‍රමවේදයද උපයෝගී කර ගනිමින් ආයතනික පුහුණු වැඩසටහන් 20ක් පැවැත්වීම.

13. ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා ගිවිසුම්ගතව කොවිඩ් වසංගත තත්වය යටතේ නැවත මෙරටට පැමිණි විදේශ ශ්‍රමිකයන් 1000ක් සඳහා පෙර දැනුම ඇගයීමේ ක්‍රමවේදය (RPL) යටතේ ඇගයීම් කර ඔවුන්ගේ නිපුණතාවයට වටිනාකමක් ලබා දීම.

14. මහජන උපයෝගීතා කොමිෂන් සභාව හා ගිවිසුම්ගතව විදුලි කාර්මික, පෙදරේරු, ජලනල කාර්මික, සූර්ය බල කාර්මික ක්ෂේත්‍රයන් නියෝජනය කරන ශ්‍රමිකයන් 5,000කට පෙර දැනුම ඇගයීම ක්‍රමවේදය (RPL) යටතේ ඇගයීම් සිදු කිරීම.



චිරංග බස්නායක
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

# ඉහළ හා ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කාර්යය මණ්ඩලය

**සභාපති**

චිරංග බස්නායක මහතා - 2021.04.08 සිට මේ දක්වා
දමිත වික්‍රමසිංහ මහතා - 2020.11.09 සිට 2021.03.31 දක්වා

**උප සභාපති**

මහේෂ් ආරියරත්න මහතා - 2021.05.10 සිට මේ දක්වා
සංජය ජයමාන්න මහතා - 2020.03.02 සිට 2021.03.31 දක්වා

**අධ්‍යක්ෂ ජනරාල්**

එච්. චූලාංගනී පෙරේරා මිය

**අධ්‍යක්ෂවරු**

1. ඩබ්.ඒ. රණවීර මහතා (මානව සම්පත් හා පරිපාලන)
2. සමන් කුලසූරිය මහතා (වෘත්තීය මාර්ගෝපදේශන, රැකියාගත කිරීම් හා ප්‍රවර්ධන) (2021.09.22 සේවයෙන් ඉවත් විය)
3. යූ.කේ. නන්ද මහතා (පරික්ෂණ හා ඇගයීම් )
4. එස්.එම්. විදිරිසිංහ මිය (පුහුණු)
5. එම්.ඒ. නජීඩ් අහමඩ් මහතා ( සැලසුම් පර්යේෂණ හා සංවර්ධන 2020.05.21 සිට ද්විතීයික පදනම මත)
6. ජේ.ඒ.ඩී.එස්. නිශාමනී මිය (මුදල්) (2019.12.19 සිට වැඩ බැලීම)
7. සී.ජේ. විදානපතිරණ මහතා (වෘත්තීය මාර්ගෝපදේශන, රැකියාගත කිරීම් හා ප්‍රවර්ධන) (2021.09.29 සිට වැඩ බැලීම)

**ප්‍රධාන අභ්‍යන්තර විගණක**

1. ආර්. පී. හෙට්ටිආරච්චි මහතා (රාජකාරී ඉටු කිරීම) - 2021.08.03 දින සිට සේවයෙන් විශ්‍රාම ගොස් ඇත
2. එල්.එන්.ජී.එස්. කුමාර මහතා (රාජකාරී ඉටු කිරීම) - (2021.11.17 සිට )

**නියෝජ්‍ය අධ්‍යක්ෂවරු**

1. එන්.එස්.ඩී. නවරත්න මහතා (2021.01.29 දින සිට විශ්‍රාම)
2. ඩී.ආර්.එස්.එල්. දසනායක මහතා (2021.03.10 දින සිට විශ්‍රාම)
3. ඊ.ඒ.ඩී.එස් සේනාරත්න මහතා
4. ජී.වී.පී.එන්. පෙරේරා මහතා
5. එච්.ඩබ්. රොහාන් ප්‍රියන්ත මහතා
6. ඩබ්.ජී. විජේරත්න මහතා
7. ඒ.එම්.ටී.එස්. ආටිගල මහතා
8. වී. කනගසුන්දරම් මහතා
9. ටී. විනෝදරාජා මහතා
10. පී.එන්. අබේසිංහ මහතා
11. ඩී.ඒ.එස්. අතුකෝරල මහතා
12. ආර්.එම්.ආර්.රත්නායක මහතා
13. බී.එච්.ඒ. නෙල්සන් මහතා
14. එච්.ඒ.පී. ගුණවර්ධන මහතා
15. එම්.ජී.ජී. සමන් මහතා
16. ආර්. සුනිල් මහතා
17. ජී.එච්.පී. දමයන්ති මිය
18. එන්.එම්.වී.කේ. හේරත් මිය
19. එම්.කේ.බී. ජයතිලක මහතා
20. වී.ජී. නිමල්සිරි මහතා
21. එස්. මැද්දේගොඩ මහතා
22. එම්.බී. නලීම් මහතා
23. ආර්. පතිරගේ මිය.
24. ඒ.ඒ. ජබීර් මහතා (2020.02.19)
25. ජී.එල්.ඒ. පීරිස් මහතා
26. කේ.ඩී.එන්. ද සිල්වා මහතා
27. පී.ජේ. ජයවර්ධන මිය
28. ඩබ්ලිව්.එම්.ඒ.එස්.එල්. විජේනායක මිය

**සහකාර අධ්‍යක්ෂවරු**

1. රාධ ක්‍රිෂ්ණන් මධුරතන් මහතා
2. කේ. නිරංජන් මහතා
3. ඒ.ඒ.ඩබ්.ජී.ආර්.ආර්. බණ්ඩාර මහතා
4. පී.ජී. ප්‍රසන්න මහතා
5. එච්. එදිරිසිංහ මිය
6. ඒ.ඒ.ඩී.ටී. ශාන්ත මහතා
7. ටී.වී.ඩබ්. දේවප්‍රිය මහතා
8. යූ.ජී.ජේ. ප්‍රියදර්ශන මහතා
9. ආර්.ඩී. ප්‍රදීපිකා මිය
10. ඊ.ජේ. විජේතුංග මහතා
11. එච්.එල්. සිසිර මහතා
12. ඩබ්ලිව්.කේ. සුමිත් වසන්ත මහතා
13. ආර්. අභිලන් මහතා
14. එච්.ටී.ඩී.ආර්.එස්. විජේසිංහ මහතා
15. තිළිණ රණසිංහ මහතා
16. ජී.ඩී. ශ්‍යාමලී මිය
17. සී. ඩී. සමරනායක මහතා
18. සී.යූ.එම්. කොඩිතුවක්කු මිය
19. සුනිල් අබේසිංහ මහතා
20. ජී.කේ.ඩී.සී. කුමාර මහතා
21. එස්.එම්.ජේ. සුවේන්ද්‍ර මහතා
22. එස්.එම්.එම්.කේ. සියමුදලි  මිය
23. එන්.කේ. අඹගහවත්ත මිය
24. ඩී.සී.ඕ. විතාන මිය
25. ඒ.ඩී.එස්. සමරසිංහ මහතා
26. ඒ.පී. ජගත් නිශාන්ත මහතා
27. එල්.පී.කේ.ඩබ්ලිව්. වැලිවත්ත මහතා
28. ඩී.එම්. යහම්පත් මහතා
29. කේ.පී.ඩී.පී. සිරිසේන මහතා
30. එන්.ඒ.ඒ.ඩී. නාගහවත්ත මහතා
31. එම්.එම්.එන්.බී. මධුරසිංහ මහතා
32. එන්.ඩී.ඩී.එදිරිසිංහ මිය
33. එන්.ටී. දළුවත්ත මිය
34. කේ.එස්.ජී.එස්. ගුණසේකර මහතා
35. එම්.ඩී.ඒ.එම්. අමරසිංහ මිය
36. ටී.එම්.ඒ. තෙන්නකෝන් මහතා
37. අයි.යූ .වික්‍රමනායක මිය
38. කේ.ඩී.පී. කුමාර මහතා
39. එච්.ඒ.ඩී.ආර්. ජයරත්න මහතා
40. එච්.ඩබ්.ආර්.එස්. ජයවර්ධන මහතා
41. ඒ.කේ. ජයවර්ධන මිය
42. එන්.ජී.ඩී.අයි. ගුණරත්න මහතා
43. කේ.ඩබ්. රංජිත් ලාල් මහතා
44. එස්.එම්.එස්.බී. සමරකෝන් මහතා
45. එස්.ඒ.ඒ.එස්. අතුකෝරල මහතා
46. කේ.ජී. භාතිය අමරනාථ මහතා
47. අයි.එම්.එන්. දිසානායක මහතා
48. බී.ජී.ඩී.කේ. කාරියවසම් මිය
49. කේ. කේ. සෝගීස්මන් මහතා
50. පී.එන්. රණවීර මහතා
51. කේ. අභිෂාදනා මිය
52. ජේ. ඉනෝකා යූ. පී. ගුණවර්ධන මෙනෙවිය (2021.10.07 සිට සේවයෙන් ඉල්ලා අස් විය)
53. ආර්.එම්.එස්.පී.ජී.කේ.රත්නායක මිය (2021.10.04 දින සිට සේවයට පත් කරන ලද අතර 2021.10.18 දින සිට සේවයෙන් ඉල්ලා අස් වී ඇත )
54. ඩී.එම්.පී.එස්. අතුකෝරළ මහතා (2021.08.05 දින සිට සේවයෙන් ඉල්ලා අස් විය)
55. එම්. පී. හර්ෂණ කුසුම්සිරි මහතා  (2021.06.13 දින සිට සේවයෙන් ඉල්ලා අස්විය)

**නීති නිලධාරී**

ඩි. ඒ. එස්. ආලෝකා ද සිල්වා මිය

# කාර්යය මණ්ඩල සංයුතිය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනයන්ට අනුව 2021.12.31 දිනට ඒ ඒ තනතුරු මට්ටමින් 1,918 දෙනෙකු සේවයේ යෙදී සිටි ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2021 වර්ෂය සඳහා අනුමත කාර්යය මණ්ඩලය 2,656 කි.

| | තනතුර | අනුමත කාර්යය මණ්ඩලය | වසර අවසානය වන විට කාර්යය මණ්ඩලය | වර්ෂය අවසානයේ පුරප්පාඩු / අතිරික්තය | සේවා කාණ්ඩය |
|---|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 | HM 2-1 |
| 02 | අධ්‍යක්ෂ | 6 | 4 | 2 | HM1-1 |
| 03 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 0 | 1 | |
| 04 | විදුහල්පති | 1 | 0 | 1 | MM 1-3 |
| 05 | නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ | 85 | 77 | 8 | MM 1-1 |
| 06 | සහකාර අධ්‍යක්ෂ - ප්‍රසම්පාදන | 1 | 1 | 0 | |
| 07 | සහකාර අධ්‍යක්ෂ - අධ්‍යයන | 3 | 0 | 3 | |
| 08 | සහකාර අධ්‍යක්ෂ - කාර්මික | 1 | 0 | 1 | |
| 09 | සහකාර ලේඛකාධිකාරී | 1 | 0 | 1 | |
| 10 | නීති නිළධාරී | 1 | 1 | 0 | |
| 11 | අභ්‍යන්තර විගණක | 1 | 0 | 1 | |
| 12 | ඉංජිනේරු | 1 | 0 | 1 | |
| 13 | පරිපාලන නිළධාරී | 3 | 2 | 1 | JM 1-1 |
| 14 | පරීක්ෂණ හා ඇගයීම් නිළධාරී | 13 | 7 | 6 | |
| 15 | විමර්ශන නිළධාරී | 1 | 1 | 0 | |
| 16 | ප්‍රවාහන නිළධාරී | 1 | 0 | 1 | |
| 17 | සැපයුම් නිළධාරී | 1 | 1 | 0 | |
| 18 | මුද්‍රණ නිළධාරී | 1 | 0 | 1 | |
| 19 | අභ්‍යන්තර විගණන නිළධාරී | 3 | 3 | 0 | |
| 20 | පද්ධති විශ්ලේෂක | 1 | 0 | 1 | |
| 21 | සුභසාධක නිළධාරී | 1 | 1 | 0 | |
| 22 | ගිණුම් නිළධාරී | 33 | 29 | 4 | |
| 23 | ජ්‍යෙෂ්ඨ වැඩසටහන් නිළධාරී | 10 | 9 | 0 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 24 | පුහුණු නිළධාරී | 98 | 51 | 47 | |
| 25 | පර්යේෂණ නිළධාරී | 2 | 2 | 0 | |
| 26 | සැළසුම් නිළධාරී | 2 | 1 | 1 | |
| 27 | සභාපති සඳහා වූ පෞද්ගලික සහකාර | 1 | 0 | | |
| 28 | පෞද්ගලික සහකාර* | 7 | 5 | 0 | |
| 29 | භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) | 1 | 0 | 1 | MA 5-2 |
| 30 | භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | 3 | 0 | 3 | |
| 31 | ජ්‍යෙෂ්ඨ උපදේශක | 201 | 117 | 84 | MA 4 |
| 32 | වැඩසටහන් නිළධාරී | 70 | 60 | 10 | |
| 33 | විගණන සහකාර * | 3 | 0 | 0 | |
| 34 | සහකාර පුස්තකාලාධිපති | 1 | 0 | 1 | MA 3 |
| 35 | ව්‍යාපෘති සහකාර * | 34 | 7 | 0 | |
| 36 | තාක්ෂණික සහකාර | 3 | 1 | 2 | MA 2-2 |
| 37 | උපදේශක | 1529 | 1120 | 409 | |
| 38 | ක්‍රීඩා උපදේශක | 31 | 0 | 31 | |
| 39 | සැලසුම් ශිල්පී | 1 | 0 | 1 | |
| 40 | ප්‍රමාණ සමීක්ෂක | 2 | 0 | 2 | |
| 41 | කාර්මික නිලධාරී(සිවිල්) | 5 | 0 | 5 | |
| 42 | කළමනාකරණ සහකාර | 196 | 190 | 6 | MA 1-2 |
| 43 | සහකාර උපදේශක (LRUC)* | 38 | 31 | 0 | |
| 44 | ඇමුණුම්කරු (මුද්‍රණ) | 3 | 1 | 2 | |
| 45 | නිවාඩු නිකේතන භාරකරු | 2 | 0 | 2 | |
| 46 | සුපරීක්ෂක (මුද්‍රණ) | 1 | 0 | 1 | |
| 47 | සුපරීක්ෂක (ගොඩනැගිලි) | 1 | 0 | 1 | |
| 48 | රියදුරු | 67 | 59 | 8 | PL 3 |
| 49 | ගබඩාකරු * | 2 | 2 | 0 | PL 2 |
| 50 | මුද්‍රණ සහයක | 3 | 2 | 1 | |
| 51 | බැඳුම්කරු (මුද්‍රණ) | 2 | 1 | 1 | |
| 52 | යන්ත්‍ර ක්‍රියාකරු (මුද්‍රණ) | 2 | 2 | 0 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 53 | කාර්යාල සහයක | 8 | 5 | 3 | PL 1 |
| 54 | මුරකරු * | 65 | 37 | 0 | |
| 55 | කම්කරු | 101 | 87 | 14 | |
| | **එකතුව** | **2656** | **1918** | **669** | |

* දැනට එම තනතුර දරන පුද්ගලයින්ට පෞද්ගලික වන සේ එම තනතුරු අනුමත කර ඇතග  ඔවුන් විශ්‍රාම යාමත් සමඟ එම තනතුර අහෝසි වේ.

## කාර්යය මණ්ඩල සංයුතිය (සේවා කාණ්ඩය අනුව)

| | තනතුර | අනුමත කාර්යය මණ්ඩලය | වසර අවසානය වනවිට කාර්යය මණ්ඩලය | වර්ෂය අවසානයේ පුරප්පාඩු / අතිරික්තය |
|---|---|---|---|---|
| 01 | HM 2-1 ජ්‍යෙෂ්ඨ කළමනාකාර<br>HM 1-1 ජ්‍යෙෂ්ඨ කළමනාකාර | 08 | 05 | 03 |
| 02 | MM 1-3 විදුහල්පති | 01 | 0 | 01 |
| 03 | MM 1-1 කළමනාකාර | 94 | 79 | 15 |
| 04 | JM 1-1 කණිෂ්ඨ කළමනාකාර | 178 | 112 (*05) | 62 |
| 04 | MA 5-2 බලාත්මක කිරීමේ / ක්‍රියාත්මක කිරීමේ / ව්‍යාප්ති නිලධාරීන් | 04 | 0 | 04 |
| 05 | MA 4 ක්‍රියාත්මක කිරීමේ/ උපදේශන සේවා | 274 | 177 (*0) | 94 |
| 06 | MA 3 ආශ්‍රිත නිලධාරීන් | 35 | 07 (*07) | 1 |
| 07 | MA 2-2 කළමනාකරණ සහකාර - තාක්ෂණ | 1571 | 1121 | 450 |
| 08 | MA 1-2 කළමනාකරණ සහකාර - තාක්ෂණ නොවන | 241 | 222 (*31) | 12 |
| 09 | PL 3 ප්‍රාථමික ශිල්පී | 67 | 59 | 08 |
| 10 | PL 2 ප්‍රාථමික අර්ධ ශිල්පී | 09 | 07(*02) | 02 |
| 11 | PL 1 ප්‍රාථමික ශිල්පී නොවන | 174 | 129 (*37) | 17 |
| | **එකතුව** | **2656** | **1918** | **669** |

* දැනට එම තනතුර දරන පුද්ගලයින්ට පෞද්ගලික වන සේ එම තනතුරු අනුමත කර ඇත. ඔවුන් විශ්‍රාම යාමත් සමඟ එම තනතුර අහෝසි වේ.

සේවා බාණ්ඩය අනුව කාර්යය මණ්ඩලය




## කාර්යය මණ්ඩලයේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ කාර්යය මණ්ඩලයේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය වාර්ෂිකවම සිදුකරනු ලබන අතර ඒ සඳහා 2021 වර්ෂයේ අධ්‍යයන කාර්යය මණ්ඩලය හා අනධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා රු. මිලියන 08 ක් වෙන් කරනු ලැබුවද Covid තත්වය යටතේ කාර්යය මණ්ඩලය පුහුණු කිරීම සීමා කිරීමට සිදු විය. එහෙත් මාර්ගගත ක්‍රමවේදය උපයෝගී කරගනිමින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය.

2021 වර්ෂයේ දී පහත වර්ගීකරණයක් යටතේ කාර්යය මණ්ඩලය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවීමට හැකිවිය.

| | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගිවු සංඛ්‍යාව |
|---|---|---|
| අධ්‍යයන | 30 | * 4192 (මාර්ගගත ක්‍රමය ඇතුළුව) |
| අනධ්‍යන | 4 | 168 |

* එක් උපදේශකවරයෙකු වැඩසටහන් කිහිපයකට සහභාගී වී ඇත.



# වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම

2021 වර්ෂයේ පූර්ණකාලීන 1328 හා අර්ධකාලීන පාඨමාලා 191 කට ඇතුලත් වන පුහුණු වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක කර ආයතනික පුහුණුව ලැබූ ආධුනිකයින් සංඛ්‍යාව 33416 කි.

### වෘත්තීය පුහුණුව සඳහා ඇතුලත් වීම / පුහුණුව අවසන් කිරීම

| වර්ෂය | 2019 | 2020 | 2021 |
|---|---|---|---|
| පුහුණුවට ඇතුලත් වූ සංඛ්‍යාව | 37,936 | 23,455 | 33,416 |
| පුහුණුව අවසන් කල සංඛ්‍යාව | 30,674 | 17,349 | 8,320 |

* කොවිඩ් 19 ගෝලීය වසංගත තත්වය මත 2021 වර්ෂයේ පුහුණුව සඳහා ඇතුලත් වූ ආධුනිකයින්ගෙන් කොටසක් 2022 වසරේ මාර්තු මාසයේදී පුහුණුව අවසන් කිරීමට නියමිතය.

### වෘත්තීය පුහුණුව සදහා ඇතුලත් වීම/පුහුණුව  අවසන් කිරීම



## පුහුණු පාඨමාලා ක්ෂේත්‍ර අනුව ආධුනික බඳවා ගැනීම - 2021

| | ක්ෂේත්‍රය | ඇතුලත් වූ ආධුනික සංඛ්‍යාව (ආයතනික පුහුණුව) | ප්‍රතිශතය |
|---|---|---|---|
| 1 | කෘෂිකර්ම වැවිලි හා පශු සම්පත් | 69 | 0.21% |
| 2 | මෝටර් රථ අලුත් වැඩියා හා නඩත්තුව | 2,284 | 6.84% |
| 3 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 2,509 | 7.51% |
| 4 | විදුලි හා විද්‍යුත් සහ විදුලි සංදේශ | 3,085 | 9.23% |
| 5 | ධීවර හා මත්ස්‍ය වගාව | 53 | 0.16% |
| 6 | ආහාර තාක්ෂණය | 909 | 2.72% |
| 7 | මැණික් හා ස්වර්ණාභරණ | 78 | 8.68% |
| 8 | හෝටල් හා සංචාරක | 2,899 | 8.50% |
| 9 | තොරතුරු තාක්ෂණ සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණය | 12,149 | 36.36% |
| 10 | සම් ආශ්‍රිත නිෂ්පාදන | 24 | 0.07% |
| 11 | ලෝහ හා ලුහු ඉංජිනේරු | 1,019 | 3.05% |
| 12 | කාර්යාල කළමනාකරණය | 173 | 0.52% |
| 13 | දැව ආශ්‍රිත | 588 | 1.76% |
| 14 | පුද්ගල හා සමාජ | 3,918 | 11.72% |
| 15 | මුද්‍රණ හා ඇසුරුම් | 45 | 0.13% |
| 16 | ශීතකරණ හා වායුසමීකරණ | 572 | 1.71% |
| 17 | රෙදිපිළි හා ඇගළුම් | 2,683 | 8.03% |
| 18 | සෞඛ්‍ය හා සමාජ කටයුතු | 130 | 0.39% |
| 19 | වෙනත් | 229 | 0.69% |
| | එකතුව | 33,416 | 100.00 |

### පුහුණුවට බඳවා ගැනීම -2021



රැකියා අවස්ථා බහුල ශ්‍රම වෙළඳපොල ඉල්ලුම සහිත පාඨමාලා සඳහා ඇතුලත්වන ආධුනික සංඛ්‍යාව සමස්ත ඇතුලත් වීමෙන් 35.73% කි.

| ක්ෂේත්‍රය | පිරිමි | ගැහැණු | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| මෝටර් රථ අලුත්වැඩියා හා නඩත්තුව | 2,224 | 60 | 2,284 | 6.84% |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1,885 | 6,24 | 2,509 | 7.51% |
| විදුලි, විද්‍යුත් සහ විදුලි සංදේශ | 2,984 | 101 | 3,085 | 9.23% |
| හෝටල් හා සංචාරක | 2,453 | 446 | 2,899 | 8.68% |
| දැව ආශ්‍රිත | 540 | 48 | 588 | 1.76% |
| ශීතකරණ හා වායුසමීකරණ | 571 | 1 | 572 | 1.71% |
| **එකතුව** | **10,657** | **1,280** | **11,937** | **35.73%** |



# වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය

2021 වර්ෂයේ දිවයින පුරා ක්‍රියාත්මක වූ පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව පහත පරිදි වේ. එයට අමතරව බන්ධනාගාර 03 කත්, පුනරුත්ථාපන මධ්‍යස්ථාන 01 කත් වෘත්තීය පුහුණු පාඨමාලා පැවැත්විය.

| පුහුණු මධ්‍යස්ථාන | 2019 | 2020 | 2021 |
|---|---|---|---|
| ජාතික වෘත්තීය පුහුණු ආයතනය | 08 | 08 | 08 |
| දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන | 22 | 22 | 22 |
| වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන | 181 | 181 | 179 |
| තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි අනෙකුත් මධ්‍යස්ථාන (බන්ධනාගාර හා පුනරුත්ථාපන) | 05 | 05 | 04 |
| **එකතුව** | **216** | **216** | **213** |

2021 වර්ෂය ආරම්භයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 215ක් ක්‍රියාත්මක වූ අතර ගම්පහ දිස්ත්‍රික්කයේ දළුපොත බන්ධානාගාරයේ ක්‍රියාත්මක වූ පුහුණු මධ්‍යස්ථානය වසා දැමීම හා කෑගල්ල දිස්ත්‍රික්කයේ රංවල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වෑවලදෙණිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට අනුයුක්ත කිරීම හේතුවෙන් සමස්ථ මධ්‍යස්ථාන සංඛ්‍යාව 213ක් විය.

**පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය -2021**



## වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය 2021

| පළාත | දිස්ත්‍රික්කය | ආයතන සංඛ්‍යාව | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | NVTI | DVTC | VTC | AT | PC | Reh | |
| බස්නාහිර | ගම්පහ | - | 1 | 13 | 3 | - | - | 14 |
| | කොළඹ | 3 | 1 | 10 | 1 | [1] | - | 15 |
| | කළුතර | - | 1 | 7 | 1 | - | - | 08 |
| වයඹ | පුත්තලම | - | 1 | 6 | - | - | - | 07 |
| | කුරුණෑගල | - | 1 | 7 | - | - | - | 08 |
| උතුර | යාපනය | - | 1 | 5 | 0 | - | - | 06 |
| | කිලිනොච්චිය | - | 1 | 4 | - | - | - | 05 |
| | මුලතිව් | - | 1 | 2 | - | - | - | 03 |
| | මන්නාරම | - | - | 1 | - | - | - | 01 |
| | වව්නියාව | - | 1 | 3 | 3 | - | - | 04 |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | - | 1 | 7 | - | - | - | 08 |
| | මඩකලපුව | 1 | - | 10 | - | - | - | 11 |
| | අම්පාර | - | 1 | 12 | 1 | - | - | 13 |
| දකුණ | ගාල්ල | 2 | 1 | 12 | 3 | 2 | - | 15 |
| | මාතර | 1 | - | 12 | - | - | - | 13 |
| | හම්බන්තොට | 1 | 1 | 09 | - | - | - | 11 |
| සබරගමුව | කෑගල්ල | - | 1 | 7 | 1 | 1 | - | 08 |
| | රත්නපුරය | - | 1 | 11 | - | - | - | 12 |
| ඌව | බදුල්ල | - | 1 | 7 | - | 1 | - | 08 |
| | මොණරාගල | - | 1 | 7 | - | 1[1] | - | 09 |
| මධ්‍යම | මහනුවර | - | 1 | 8 | - | 2 | - | 09 |
| | මාතලේ | - | 1 | 5 | - | - | - | 06 |
| | නුවරඑළිය | - | 1 | 4 | - | - | - | 05 |
| උතුරු මැද | අනුරාධපුර | - | 1 | 7 | 1 | - | - | 8 |
| | පොලොන්නරුව | - | 1 | 3 | 1 | [1] | [1] | 6 |
| | **එකතුව** | **8** | **22** | **179** | **15** | **03** | **1** | **213** |

NVTI - **ජාතික වෘත්තීය පුහුණු ආයතන**
DVTC - **දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන**
VTC - **වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන**
AT - **අනුබද්ධිත**
PC - **බන්ධනාගාර**
Reh - **පුනරුත්ථාපන මධ්‍යස්ථාන**
[ ] - **පුහුණු මධ්‍යස්ථාන ලෙස TVEC ලියාපදිංචිව ඇති මධ්‍යස්ථාන**

## වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය 2021



# වෘත්තීය පරීක්ෂණ හා ඇගයීම්

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පුහුණුව ලත් ආධුනිකයින් ඇගයීම් ක්‍රමවේදයන් මගින් ඇගයීම් කර සහතිකපත්ලාභීන් බවට පත්කරනු ලැබේ. මේ සඳහා වාර්ෂිකව රුපියල් මිලියන 40 කට අධික මුදලක් වැයකරනු ලැබේ. Covid තත්වය යටතේ වුවද 2021 වර්ෂයේදී ඇගයීම් සිදුකර නිකුත් කල සහතිකපත් ප්‍රමාණය පහත පරිදි වේ.

| **අංක** | **වර්ගය** | **නිකුත් කල සහතිකපත් ප්‍රමාණය** |
|---|---|---|
| 01 | ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) | 13746 |
| 02 | ජාතික වෘත්තීය සුදුසුකම් නොවන (Non NVQ) | 3587 |
| 03 | පෙරදැනුම ඇගයීම් ක්‍රමය (RPL) | 1413 |
| | **එකතුව** | **18746** |

**නිකුත් කල සහතිකපත් ප්‍රමාණය**



# වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය

තරුණ තරුණියන්ගේ රුචිකත්වය හා සුදුසුකම් මත ගැලපෙන වෘත්තීය ක්ෂේත්‍ර තෝරා ගැනීමට මඟ පෙන්වීම ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ තවත් කර්තව්‍යයකි. ඒ සඳහා සුදුසුකම් ලත් නිළධාරී මණ්ඩලයක් විසින් යෞවන යෞවනියන්ගේ රුචිකත්වය හා සුදුසුකම් මත ඔවුනට ගැලපෙන වෘත්තීය ක්ෂේත්‍ර තෝරා ගැනීමට දීපව්‍යාප්තව වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පවත්වනු ලැබේ. 2021 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත පරිදි වේ. මින් බොහොමයක් මාර්ගගත ක්‍රමවේදය යටතේ හා ගමින් ගමට වැඩසටහන යටතේ සිදුවිය.

| ඉලක්කගත කණ්ඩායම | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| පාසැල් සිසුන් | 159 | 7752 |
| පාසැල් හැරයන්නන් | 320 | 14214 |
| පුහුණුවන්නන් | 388 | 15868 |
| දෙමාපියන් | 163 | 7093 |
| වෙනත් | 217 | 13536 |
| **එකතුව** | **1247** | **58463** |

### වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන්



# රැකියාගත කිරීම

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණුවන්නන් වැඩිදුර පුහුණු ව සඳහා යොමු කිරීම, රැකියා අවස්ථා සඳහා යොමු කිරීම හා පවත්නා පාඨමාලා යාවත්කාලීන කිරීම අරමුණු කර ගනිමින් පිහිටවූ කර්මාන්ත සබඳතා අංශය මේ වන විට විවිධ පෞද්ගලික ආයතන හා එක්ව කටයුතු කිරීම අරඹා ඇත.

කර්මාන්ත සබඳතා අංශය විසින් ආයතනික පුහුණුව අවසන් කල පුහුණුලාභීන් වැඩිදුර පුහුණුව සඳහා යොමු කරනු ලබන අතර ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ලියාපදිංචි කරන ලද දේශීය හා විදේශීය රැකියා ආයතන මගින් රැකියා ගත කිරීම් කරනු ලැබේ.

එසේ රැකියාගත කිරීම සිදුකරනු ලබන්නේ පාඨමාලාව සාර්ථකව නිමකළ තරුණ තරුණියන් වන අතර පහත වර්ගීකරණයන්ට ලක්වන සියල්ලන් රැකියාගත කිරීමට ලක් නොවේ.

- වෘත්තීය පුහුණු පාඨමාලා හදාරනු ලබන ත්‍රිවිධ හමුදා සාමාජිකයින්
- බන්ධනාගාර රැඳවියන්
- නැගෙනහිර පළාතේ හා පුත්තලම් දිස්ත්‍රික්කයන්හි පහත පාඨමාලා හදාරනු ලබන පුහුණුලාභීන් ප්‍රතිශතයක් බොහෝ විට තම පෞද්ගලික අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට පුහුණුව ලබා ගනු ලැබේ.
    - (a) රූපලාවන්‍ය
    - (b) කොණ්ඩා සැකසුම්
    - (c) සාමාන්‍ය මැහුම්
- ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 3 හා 4 හදාරා ඉදිරි NVQ මට්ටම් හැදෑරීමට බලාපොරොත්තු වන ආධුනිකයින් හා උසස් අධ්‍යාපනයට යොමුවන්නන්
- අර්ධකාලීන පාඨමාලා හදාරනු ලබනුයේ රැකියාගත වූ දැනුම, කුසලතා වර්ධනය කරගැනීම අරමුණු කර ගත් පිරිසක් වීම.
- එමෙන්ම ග්‍රාමීය පුහුණු මධ්‍යස්ථාන වල පුහුණුව ලැබූ වැඩි පිරිසක් රැකියා බහුලව කේන්ද්‍රීයව පවතින නාගරික ප්‍රදේශයන්හි රැකියාගත වීමට ඇති අකමැත්ත හා ගෙවනු ලබන වැටුප් ඔවුනට නේවාසිකව සිට රැකියා කිරීමට ප්‍රමාණවත් නොවීම.
- අප ආයතනයේ ලියාපදිංචි නොවූ විදේශ රැකියා නියෝජිත ආයතන මගින් විදේශ රැකියා සඳහා යොමුවන්නන්.

එසේ වුවද COVID වසංගත තත්ත්වය යටතේ රැකියා අවස්ථා සොයා ගැනීම අසීරු වුවද දත්ත තහවුරු කර ගත් පුහුණුලාභීන් 1138 ක් රැකියාගත වීම 2021.12.31 දිනට වාර්තා වී ඇති අතර අනෙකුත් රැකියා ස්ථානගත වීම් තහවුරු කර ගනිමින් පවතී.

කර්මාන්ත සබඳතා අංශය විසින් දිස්ත්‍රික් මට්ටමින් කර්මාන්ත සැසි පිහිටු වීම හා රැකියා වෙළඳපොල පැවැත්වීමට ආරම්භ කර ඇති අතර ඒ තුලින් රැකියාගත කිරීම තවදුරටත් වර්ධනය කර ගැනීමට අපේක්ෂිතය.

| අංකය | පුහුණු ක්ෂේත්‍රය | රැකියා ගත කල සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|
| | | දේශීය | විදේශීය | ස්වයං | එකතුව |
| 01. | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 103 | 3 | 14 | 120 |
| 02. | මෝටර් රථ අලුත්වැඩියාව හා නඩත්තුව | 68 | - | 16 | 84 |
| 03. | විදුලි, විද්‍යුත් හා විදුලි සංදේශ | 132 | 2 | 4 | 138 |
| 04. | ශීතකරණ හා වායු සමීකරණ | 25 | 15 | 1 | 41 |
| 05. | ආහාර තාක්ෂණය | 52 | - | 5 | 57 |
| 06. | සන්නිවේදනය හා බහුමාධ්‍ය තාක්ෂණය | 190 | - | 5 | 195 |
| 07. | හෝටල් හා සංචාරක | 46 | 1 | - | 47 |
| 08. | ලෝහ හා ලුහු ඉංජිනේරු | 52 | - | 1 | 53 |
| 09. | දැව ආශ්‍රිත | 27 | - | 6 | 33 |
| 10. | මැණික් හා ස්වර්ණාභරණ | 29 | 6 | - | 35 |
| 11. | මුද්‍රණ හා ඇසුරුම් | - | - | - | - |
| 12. | රෙදිපිළි හා ඇඟලුම් | 78 | - | 86 | 164 |
| 13. | පුද්ගල හා සමාජ | 129 | 1 | 37 | 167 |
| 14. | කාර්යාල කළමනාකරණය | 4 | - | - | 4 |
| | **එකතුව** | **935** | **28** | **175** | **1138** |

## රැකියාගත කිරීම



## රැකියා ස්ථාපනය තුලින් ජාතික ආර්ථිකයට දැක්වූ දායකත්වය

| වර්ගය | ස්ථාපනය කළ සංඛ්‍යාව | ජාතික ආර්ථිකයට දැක්වූ දායකත්වය (රු. මිලියන) |
|---|---|---|
| දේශීය රැකියා | 935 | 390 |
| විදේශීය රැකියා | 28 | 34 |
| ස්වයං රැකියා | 175 | 70 |
| එකතුව | 1138 | 494 |

(තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ශ්‍රම වෙළඳපොල සඟරාව හා රැකියාගත කළ ආයතනයන්හී දත්ත මත 2021 වර්ෂයේ රැකියාගත කරන ලද පුහුණුලාභීන් සංඛ්‍යාව වසරක කාලයක් සේවය කරනු ලැබූ බවට උපකල්පනය කර ඉපයූ ආදායම දළ වශයෙන් ඇස්තමේන්තු කර සකස් කර ඇත.)

| වර්ෂය | දේශීය | විදේශීය | ස්වයං | එකතුව |
|---|---|---|---|---|
| 2017 | 5,378 | 146 | 1,137 | 6,661 |
| 2018 | 6,542 | 107 | 1,374 | 8,023 |
| 2019 | 3,912 | 47 | 687 | 4,646 |
| 2020 | 2,316 | 13 | 426 | 2,755 |
| 2021 | 935 | 28 | 175 | 1,138 |




(ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මඟින් රැකියාගත කල තොරතුරු පමණි.*

# රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා එක්ව සිදුකල වැඩසටහන්

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව | අනුග්‍රාහක ආයතන |
|---|---|---|---|
| ටයිල් ඇතිරීම | 05 | 215 | ලංකා ටයිල්ස් සමාගම |
| රූපලාවන්‍ය, කොණ්ඩා කැපීම | 3 | 340 | නේචර්ස් බියුටි ක්‍රියේෂන් , ටියාරා මාකටින් සමාගම |
| ඇලුමිනියම් පිරිසැකසුම් | 1 | 41 | ස්විස්ටෙක් ඇලුමිනියම් |
| විදුලි කාර්මික | 5 | 560 | ACL කේබල්ස් |
| **එකතුව** | **14** | **1156** | |

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් නිරන්තරයෙන් පෞද්ගලික අංශය හා එක්ව විවිධ ශිල්පීය දක්ෂතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් තරුණ ප්‍රජාව දිරිගැන්වීමේ කාර්යය සිදුකරනු ඇත. 2021 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට වැඩසටහන් 33ක් ඉලක්ක කලද Covid 19 තත්වය යටතේ ක්‍රියාත්මක කිරීමට හැකි වූයේ වැඩසටහන් 14ක් පමණි.



# ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

තරුණ ව්‍යවසායකයින් දිරිගන්වමින් ඔවුන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් වැඩි දියුණු කිරීම හා ඔවුන්ට අත හිත දීම ද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ප්‍රධාන අරමුණ වේ.

ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් 17 ක් පවත්වා 313 ක් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව ලබාදීමට හැකි වූ අතර Covid 19 තත්වය යටතේ වැඩසටහන් පැවැත්වීම සීමා වූ අතර ස්වයං රැකියා ආරම්භ කිරීමට අදාළ වූ SEPI ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දීම මෙම වසරේදී ඉටුකල නොහැකි විය.

## අභියෝග

- නවීන තාක්ෂණික පුහුණු ක්‍රමවේදයන් දැනට ක්‍රියාත්මක පාඨමාලා සඳහා අන්තර්ග්‍රහණය කිරීමට සම්පත් ප්‍රමාණවත් නොවීම.
- ගුණාත්මක පුහුණුවක් ලබා දීම සඳහා අත්‍යවශ්‍ය උපදේශක කාර්යය මණ්ඩලයේ වැටුප් හා අනෙකුත් පහසුකම් ප්‍රමාණවත් මට්ටමින් ඔවුන්ට නොලැබීම මත සේවය හැරයාමේ නැඹුරුවක් පැවතීම.
- පුහුණු කටයුතු වල ගුණාත්මක භාවය සංවර්ධනය සඳහා නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් පුහුණු කටයුතු කිරීම සඳහා දැනුම, හැකියාව, පළපුරුද්ද ඇති උපදේශකවරුන්ගේ හිඟකම හා ඔවුන්ට ඉහළ මට්ටමේ වැටුපක් ගෙවීමට ඇති අපහසුතාවය.
- පවතින ගෝලීය වසංගත තත්වය නිසා අපේක්ෂා කල වැඩසටහන් ක්‍රියාත්මක කර ගත නොහැකි වීම.
- නොමිලේ වෘත්තීය අධ්‍යාපනය සැපයීම ආරම්භයත් සමඟ ඇති වී ඇති ඉල්ලුම සැපයීමට ප්‍රමාණවත් මූල්‍ය හා භෞතික සම්පත් හිඟවීම.
- කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉහළ ශ්‍රම ඉල්ලුමක් ඇති ශිල්පීය මට්ටමේ පාඨමාලාවන්ට තරුණ තරුණියන්ගේ වැඩි නැඹුරුතාවයක් නොමැතිවීම.
- තරුණ තරුණියන් වෘත්තීය පුහුණුව කෙරෙහි ආකර්ෂණය කර ගැනීමට විශාල පරිශ්‍රමයක් දැරීමට සිදුවීම හා පුළුල් ප්‍රචාරාත්මක ක්‍රියාදාමයන් සඳහා ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොලැබීම.
- වෘත්තීය පුහුණුව සපයන රාජ්‍ය නොවන සංවිධාන හා අනෙකුත් ආයතන මඟින් සපයන පහසුකම් වැඩිවීම නිසා ඒ අයුරින්ම පහසුකම් සැපයීමට අපහසුවීම මත දැඩි තරඟකාරීත්වයකට මුහුණ දීමට සිදු වීම.
- වෘත්තීය පුහුණුව සපයන පෞද්ගලික අංශයේ ආයතන හා තරඟකාරීව කටයුතු කිරීමට සිදුවීම.
- වෘත්තීය පුහුණුවේ වැදගත්කම පිළිබඳව සමාජය දැනුවත් කිරීමට හා ආකල්ප සංවර්ධනයට පුළුල් ප්‍රචාරාත්මක වැඩසටහන් දියත් කිරීමට සිදුවීම.
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සඳහා යටිතල පහසුකම් සැපයීමට ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොමැතිවීම.
- දිවයින පුරා ක්‍රියාත්මක සෑම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකටම සමාන මට්ටමේ පහසුකම් සැපයීමට අපොහොසත් වීම.
- සේවා සපයන ආයතනයක් ලෙස රජය විසින් වෙන් කරන ප්‍රාග්ධන හා පුනරාවර්තන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
- පුහුණු ක්ෂේත්‍ර හා රැකියා ඉල්ලුම අතර ඇති නොගැලපීම අවම කර ගැනීමට අත්‍යාවශ්‍ය වන නවීන තාක්ෂණික උපකරණ හිඟවීම.

# ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විගණන හා කළමණාකරණ කමිටුව

## කාර්ය සාධනය 2021

2021 වර්ෂයේ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් 03 ක් පවත්වා ඇති අතර විගණන හා කළමණාකරණ කමිටුවේ සාමාජිකයින්ගේ සංයුතිය පහත පරිදි වේ.

**කමිටු සාමාජිකයින්**

| | |
|---|---|
| විෂය මාලා සංවර්ධනය | - | 80,830.00 |
| සේවාස්ථ පුහුණුව සහ අධීක්ෂණය | 4,361,760.00 | 4,753,750.00 |
| ව්‍යවසායකත්ව වැඩසටහන් | 407,212.33 | 75,493.00 |
| රැකියාගත කිරීම | 827,827.00 | 254,534.00 |
| පර්යේෂණ සහ අන්වේශ්‍ය දීමනා | 7,302.50 | 966,325.33 |
| රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය | 136,657.00 | 211,063.83 |
| | **5,740,758.83** | **6,341,996.16** |
| 25 වෙනත් මෙහෙයුම් වියදම් | | |
| විභාග සහ ඇගයීම් | 25,689,326.80 | 33,798,801.75 |
| ගෞරව දීමනා | 423,800.00 | 555,200.00 |
| නීති ගාස්තු | 485,500.00 | 739,820.00 |
| විවිධ | 4,970,583.80 | 4,988,281.77 |
| තත්ව කළමනාකරණ ප්‍රතීතනය | 3,059,385.30 | 1,519,793.08 |
| වාර ප්‍රවේශ පත්‍ර | 1,745,422.86 | 2,946,599.53 |
| විශේෂ පුහුණු වැඩසටහන | 57,000.00 | 94,217.85 |
| වැටුප් දීමනා | 57,500.00 | 8,765,249.80 |
| ආවුද සහ පරිභෝජන | 770,904.00 | 271,924.00 |
| පුහුණු අධීක්ෂණය | 1,500.00 | 1,700.00 |
| අනුමත හැර යාම් | 484,300.00 | 302,000.00 |
| | **37,745,222.76** | **53,983,587.78** |

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන**

| | සටහන | 2021<br>රු. | 2020<br>නැවත සඳහන් කළ පරිදි<br>රු. |
|---|---|---|---|
| **26 විශේෂ ව්‍යාපෘති සඳහා සටහන්** | | | |
| අමාත්‍යාංශ අරමුදල සඳහා වියදම | | 81,674,000.00 | - |
| ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන | | 115,496,742.48 | 87,778,342.51 |
| මුස්ලිම් ආධාර අරමුදල සඳහා වියදම | | - | 311,000.00 |
| මහවැලි අධිකාරිය සඳහා වියදම | | - | 2,238,000.00 |
| අමාත්‍යාංශය සඳහා වියදම - 13 වසරක | | 127,138.56 | 74,945.00 |
| මුල් ළමා විය සංවර්ධනය සඳහා වියදම | | - | 305,311.00 |
| K-Tec ව්‍යාපෘතිය සඳහා වියදම | | | |
| වෙනත් ව්‍යාපෘති සඳහා වියදම | | | |
| | | **197,297,881.04** | **90,707,598.51** |
| **27 මූල්‍ය වියදම** | | | |
| බැංකු ගාස්තු | | 132,511.90 | 138,173.10 |
| | | **132,511.90** | **138,173.10** |

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**28. වගකීම් සහ ආවස්ථිකයන්**

අ. අධිකාරියට විරුද්ධ නඩු

පහත සඳහන් ආකාරයෙන් අධිකාරියට විරුද්ධව නඩු බල පැවැත්වේ.

| අධිකරණය | 2021.12.31 | 2020.12.31 |
|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 2 | 2 |
| අභියාචනාධිකරණය | 1 | 1 |
| මහාධිකරණය | - | - |
| දිස්ත්‍රික් උසාවිය | 2 | 2 |
| කම්කරු විනිශ්චයාධිකරණය | 2 | 3 |
| කම්කරු දෙපාර්තමේන්තුවේ විමර්ශනයන් | - | - |
| එකතුව | 7 | 8 |

ආ. ප්‍රාග්ධන වගකීම්

2021.12.31 දිනට ද්‍රව්‍ය ප්‍රාග්ධන වගකීම් නොමැත.

**29. බොල් ණය ප්‍රතිපාදන**

රු. 5,512,970.65 ක් වූ බොල් ණය මුදල අතරින්, රු. 3,548,334.94 ක් යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සහ ආරක්ෂක සේවා ලැබීම්වලින් ලැබීමට නියමිතය. එම කාරණය සඳහා තීරණයක් අපේක්ෂාවෙන් සිටී.

**30. කාලය සඳහා ශුද්ධ ඌණතාවය**

2021 වසර සඳහා ප්‍රකාශයේ රු. මිලියන 60 ක ඌණතාවයක් ඇත. එම හිඟය සඳහා පහත කරුණු හේතුවේ. වියදම් ලෙස පාරිතෝෂික ප්‍රතිපාදන රු. මිලියන 94 ක් දැනටමත් අඩු කර ඇත.

## ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
## 2021 දෙසැම්බර් 31 ට ශේෂ පිරික්සුම

| විස්තරය | හර | බැර |
|---|---|---|
| **ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම** | | |
| ඉඩම් සහ ඉඩම් සංවර්ධන අත්පත් කර ගැනීම | 1,617,983,527.97 | |
| ගොඩනැගිලි සහ වැඩි දියුණු කිරීම් අත්පත් කර ගැනීම | 6,501,505,574.14 | |
| පරිගණක උපකරණ අත්පත් කර ගැනීම | 362,418,855.83 | |
| ගෘහභාණ්ඩ සහ සවි කිරීම් අත්පත් කර ගැනීම | 333,144,303.07 | |
| මෝටර් වාහන අත්පත් කර ගැනීම | 245,372,793.96 | |
| පුහුණු උපකරණ අත්පත් කර ගැනීම | 1,480,711,887.57 | |
| වාහන කුලී රඳවා ගැනීම් අත්පත්කර ගැනීම (ෆිනෑන්ස්) | 35,670,270.00 | |
| **ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන** | | |
| ගොඩනැගිලි සහ වැඩි දියුණු කිරීම් ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන | | 1,875,339,708.93 |
| පරිගණක උපකරණවල ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන | | 160,594,316.22 |
| ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන | | 117,340,198.39 |
| මෝටර් වාහන ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන | | 160,559,925.95 |
| පුහුණු උපකරණ ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන | | 609,005,471.16 |
| **ප්‍රගතියේ පවතින ප්‍රාග්ධන වැඩ** | | |
| ප්‍රගතියේ පවතින වැඩ - ගොඩනැගිලි ව්‍යුහයන් | 67,295,818.35 | |
| **ආයෝජන** | | |
| ස්ථාවර තැන්පතු | 40,000,000.00 | |
| **ඉන්වෙන්ටරි** | | |
| පුහුණු ද්‍රව්‍ය | 27,531,225.63 | |
| ලිපි ද්‍රව්‍ය | 4,976,944.56 | |
| වෙනත් පාරිභෝජන ද්‍රව්‍ය | 2,972,641.22 | |
| **වෙනත් ලැබීම්** | | |
| වැඩසටහන් සඳහා අත්තිකාරම් | 145,400.00 | |
| ඉඩම් සඳහා අත්තිකාරම් | 9,280,000.00 | |
| **ඉදි කිරීම් සඳහා ජංගම අත්තිකාරම්** | | |
| අනිවාර්ය කටයුතු සඳහා තැන්පතු | 3,227,736.75 | |
| තැන්පතු | 1,662,250.00 | |
| යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | 3,548,334.94 | |
| **වාහන සේවා ආදායම් ලැබීම්** | | |
| පාඨමාලා ගාස්තු ලැබීම් | 15,873,717.50 | |
| වැටුප් ලැබීම් | 1,153,808.19 | |
| ආදායම් හිඟතාවයන් | 11,732.00 | |
| රජයේ ආයතනයන් | 1,964,635.71 | |
| වෙළඳ සහ වෙනත් ලැබීම් | 4,042,093.40 | |
| පෙර ගෙවීම් | 14,898.90 | |
| බොල් ණය සඳහා ප්‍රතිපාදන | | 5,512,970.65 |

| විස්තරය | හර | බැර |
|---|---|---|
| **සේවක ණය** | | |
| ආපදා ණය | 44,726,380.65 | |
| උත්සව අත්තිකාරම් | 402,500.00 | |
| **මුදල් සහ මුදල් සමාන දෑ** | | |
| රන් කාසි | 193,025.00 | |
| **බැංකු ගිණුම්** | | |
| අම්පාර | 1,630,064.68 | |
| අනුරාධපුරය | 260,193.29 | |
| බදුල්ල | 197,179.97 | |
| මඩකලපුව | 409,412.49 | |
| කොළඹ | 2,166,729.42 | |
| ගාල්ල | 659,327.97 | |
| ගම්පහ | 3,292,633.11 | |
| හම්බන්තොට | 1,576,472.79 | |
| ප්‍රධාන කාර්යාලය | 71,224,073.30 | |
| යාපනය | 894,625.17 | |
| කලුතර | 872,654.49 | |
| මහනුවර | 1,927,899.77 | |
| කෑගල්ල | 235,681.17 | |
| කිලිනොච්චිය | 504,928.40 | |
| කුරුණෑගල | 162,558.36 | |
| මාතලේ | 495,955.60 | |
| මාතර | 212,660.35 | |
| මොනරාගල | 174,763.76 | |
| මුලතිවු | 1,236,061.67 | |
| නුවර එළිය | 1,044,731.12 | |
| NVTI - බද්දේගම | 1,228,299.53 | |
| NVTI - මිරිජ්ජවිල | 1,103,462.47 | |
| NVTI - නාරාහේන්පිට | 2,002,598.15 | |
| NVTI - නියාගම | 324,628.03 | |
| NVTI - ඔරුගොඩවත්ත | 2,055,030.93 | |
| NVTI - රත්මලාන | 937,339.47 | |
| NVTI - තලල්ල | 766,930.81 | |
| පොළොන්නරුව | 1,587,113.11 | |
| පුත්තලම | 630,093.32 | |
| රත්නපුරය | 4,044,062.99 | |
| ත්‍රිකුණාමලය | 1,618,154.73 | |
| ඌව පළාත | 381,273.73 | |
| බස්නාහිර පළාත | 202,475.23 | |
| වවුනියාව | 600,499.42 | |
| සබරගමුව පළාත | 351,496.50 | |
| මධ්‍යම පළාත | 147,862.28 | |

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දකුණු පළාත | 181,061.39 | |
| වයඹ පළාත | 231,446.09 | |
| උතුරු මැද පළාත | 173,032.50 | |
| අතැති මුදල් | 46,120.00 | |
| අතැති චෙක්පත් | | |
| රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | | 11,033,669.11 |
| රජයේ ප්‍රදාන (භාණ්ඩාගාර) - පුනරාවර්තන | | 1,531,000,000.00 |
| විලම්භිත ආදායම් ප්‍රදාන - පුනරාවර්තන | | 539,764,710.83 |
| **<u>වෙන් කිරීම් සහ අතිරික්ත</u>** | | |
| විලම්භිත ආදායම් ප්‍රදාන | | 5,538,533,346.09 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 612,115,013.60 |
| ප්‍රත්‍යාගණනය කළ අතිරික්තය | | 2,653,836,821.05 |
| **<u>ප්‍රාග්ධන නොවන වගකීම්</u>** | | |
| BOC - ෆිනෑන්ස් කුලී වගකීම | | 24,528,280.00 |
| අවිනිශ්චිතභාවයේ පොලී | 6,168,280.00 | |
| **<u>ගෙවීම්</u>** | | |
| විගණන ගාස්තු ගෙවීම් | | 2,255,563.00 |
| පාඨමාලා ගාස්තු ගෙවීම් | | 120,300.00 |
| තැන්පතු | | 55,000.00 |
| E.P.F. ගෙවීම් | | |
| E.T.F. ගෙවීම් | | |
| දේශක ගාස්තු ගෙවීම් | | 7,999,941.42 |
| වෙනත් ගෙවීම් | | 13,060,901.68 |
| ව්‍යාපෘති ආධාර ගෙවීම් | | 18,015,275.58 |
| නිපුණතා සිසු සවිය | | 16,964,000.00 |
| යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය - 13 වසර | | 33,179,501.46 |
| අත්තිකාරම් වශයෙන් ලැබීම් | | 5,787,625.00 |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | | 2,269,726.24 |
| රඳවාගත් මුදල් | | 18,372,053.10 |
| වැටුප් ගෙවීම් | | 1,060,563.69 |
| කාර්ය මණ්ඩල දිරි දීමනා ගෙවීම් | | 151,600.00 |
| ශිෂ්‍ය රක්ෂණ ගෙවීම් | | 37,883,500.00 |
| වෙළඳ ණය ගැතියන් | | 3,140,310.80 |
| W & OP ගෙවීම් | | |
| **<u>සමුච්චිත වියදම්</u>** | | |
| සමුච්චිත වෘත්තීය මාර්ගෝපදේශනය | | 45,184.00 |
| සමුච්චිත විදුලි බලය | | 3,255,398.61 |
| සමුච්චිත විභාග සහ ඇගයීම් | | 3,848,413.00 |
| සමුච්චිත ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය | | 97,013.00 |
| සමුච්චිත සනීපාරක්ෂක සේවා | | 1,525,975.69 |
| සමුච්චිත නඩත්තු | | 8,263,305.32 |
| සමුච්චිත පුවත්පත් සහ වාර සඟරා | | 13,560.00 |

| විස්තරය | හර | බැර |
|---|---|---|
| සමුච්චිත සේවාස්ථ පුහුණුව | | 316,500.00 |
| සමුච්චිත අතිකාල සහ නිවාඩු දින ගෙවීම් | | 3,167,891.38 |
| සමුච්චිත අර්ධ කාලීන වියදම් | | 10,848,796.20 |
| සමුච්චිත ප්‍රවර්ධන වියදම් | | 1,086,432.00 |
| සමුච්චිත කුලී, වරිපනම් සහ බදු | | 105,000.00 |
| සමුච්චිත වාර ප්‍රවේශ පත්‍ර ගාස්තු | | 657,069.26 |
| සමුච්චිත ආරක්ෂණ ගාස්තු | | 3,695,304.00 |
| සමුච්චිත වැටුප් දීමනා | | 154,000.00 |
| සමුච්චිත දුරකථන ගාස්තු | | 2,530,656.35 |
| සමුච්චිත ප්‍රවාහන ගාස්තු | | 136,720.00 |
| සමුච්චිත ප්‍රවාහනය | | 413,475.93 |
| සමුච්චිත ජලය | | 735,346.94 |
| වාහන කුලී ගාස්තු | | 219,000.00 |
| **වෙනත් ආදායම්** | | |
| වෙන්දේසි ආදායම | | 2,030,410.00 |
| පාඨමාලා ගාස්තු | | 2,194,700.00 |
| ආපනශාලා ආදායම | | 432,110.00 |
| සමාගම් ලියාපදිංචිය | | |
| දෛනික කටයුතු | | 4,337,900.00 |
| ව්‍යවසායකත්ව වැඩසටහන් | | 28,500.00 |
| දඩ | | 469,608.63 |
| ශාලා ආදායම | | 221,975.00 |
| නේවාසිකාගාර ගාස්තු | | 1,268,234.99 |
| සංචාරක බංගලාව - කතරගම | | 192,740.00 |
| ණය වාරික | | 1,847,623.59 |
| විවිධ ආදායම් | | 4,651,236.65 |
| ආපසු නොගෙවන ලද ටෙන්ඩර් තැන්පතු | | 509,563.00 |
| වාර්තා පොත | | 5,991,300.00 |
| ලියාපදිංචි ගාස්තු | | 14,417,100.00 |
| නිමැවුම් භාණ්ඩ විකිණුම් | | 218,302.75 |
| ඉතිරුම් ගිණුම් පොලී | | 2,385,420.52 |
| සැපයුම් ලියාපදිංචිය | | 614,250.00 |
| විභාග ගාස්තු | | 16,558,625.00 |
| **නිෂ්පාදන ඒකක ආදායම** | | |
| ඉපැයීම් 10% | | 1,174,746.00 |
| අර්ධ කාලීන පාඨමාලා | | 19,977,177.88 |
| මුද්‍රණ පාසල නාරාහේන්පිට | | 346,857.80 |
| පෙර ඉගැනුම් හඳුනා ගැනීම (RPL) | | 8,424,120.50 |
| ක්ෂේත්‍ර පරීක්ෂණ | | |
| තලල්ල ආපන ශාලාව | | 3,869.50 |
| වෙනත් නිෂ්පාදන ඒකකය | | 789,611.88 |

| විස්තරය | හර | බැර |
|---|---|---|
| **විශේෂ ව්‍යාපෘති සඳහා ආධාර** | | |
| SSDP සඳහා ආධාර | | 115,496,742.48 |
| මුස්ලිම් ආධාර සඳහා ආධාර | | |
| අමාත්‍යාංශය සඳහා ආධාර - වසර 13 | | |
| මුල් ළමා විය සංවර්ධන සඳහා ආධාර | | |
| නිපුණතා සිසු සවිය සඳහා ආධාර | | 81,674,000.00 |
| අමාත්‍යාංශය සඳහා ආධාර | | 127,138.56 |
| **සේවක වියදම** | | |
| E.P.F. වියදම් | 122,670,490.52 | |
| E.T.F. වියදම් | 30,802,840.05 | |
| වෙනත් දීමනා (කාර්ය මණ්ඩල වියදම) | 178,822,530.00 | |
| වැටුප් සහ අතිකාල | 878,485,860.58 | |
| කාර්ය මණ්ඩල පාරිතෝෂිකය | 48,701,719.75 | |
| පාරිතෝෂිකය සඳහා අධිභාරය | | |
| **ගමනාගමනය** | | |
| නවාතැන් වියදම් | 588,553.00 | |
| ගමනා ගමනය - දේශීය | 3,994,686.82 | |
| ගමනාගමනය - විදේශීය | 4,217,628.00 | |
| භාණ්ඩ සමීක්ෂණ වියදම් | | |
| **සැපයුම් සහ වෙනත් පරිභෝජන ද්‍රව්‍ය** | | |
| ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය ගාස්තු | 17,583,189.10 | |
| වෙනත් සැපයුම් | 2,030,926.29 | |
| ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 7,736,987.53 | |
| මුද්‍රිත ද්‍රව්‍ය | 2,494,868.16 | |
| **නඩත්තුව** | | |
| ගොඩනැගිලි නඩත්තු කිරීම | 39,891,444.49 | |
| දේපල සහ පිරියත නඩත්තුව | 10,261,786.10 | |
| වාහන නඩත්තු කිරීම | 15,919,127.93 | |
| කාර්යාල උපකරණ නඩත්තුව | 2,415,603.12 | |
| **ගිවිසුම්ගත සේවා** | | |
| වෙළඳ දැන්වීම් | 2,322,988.20 | |
| විගණන ගාස්තු | 1,100,000.00 | |
| විදුලි බල ගාස්තු | 38,171,290.66 | |
| කුලී අය කිරීම් | 3,338,554.00 | |
| රක්ෂණය | 2,365,350.06 | |
| සනීපාරක්ෂක සේවා | 21,385,546.46 | |
| පුවත්පත් සහ වාර ප්‍රකාශන | 327,114.40 | |
| තැපැල් ගාස්තු | 831,355.92 | |
| කුලී, වරිපනම් සහ බදු | 7,998,414.44 | |
| ආරක්ෂක ගාස්තු | 50,752,569.58 | |
| කාර්ය මණ්ඩල සුභසාධනය සහ වෙනත් | 2,308,274.48 | |
| දුරකථන ගාස්තු | 17,357,282.53 | |

| විස්තරය | හර | බැර |
|---|---|---|
| ප්‍රවාහනය | 2,295,157.35 | |
| ජල බිල්පත් | 9,761,315.49 | |
| උපදෙස් සහ වෘත්තීය ගාස්තු | 534,032.26 | |
| **රැකියාගත කිරීම, පර්යේෂණ සහ ව්‍යවසායකත්වය** | | |
| විෂයමාලා සංවර්ධනය | | |
| සේවාස්ථ පුහුණුව සහ අධීක්ෂණය | 4,361,760.00 | |
| ව්‍යවසායකත්ව වැඩසටහන් | 407,212.33 | |
| රැකියාගත කිරීම | 827,827.00 | |
| පර්යේෂණ සහ අන්වේෂ්‍ය අධ්‍යයන | 7,302.50 | |
| පුද්ගලික සහ රාජ්‍ය හවුල්කාරීත්වය | 136,657.00 | |
| **වෙනත් මෙහෙයුම් වියදම්** | | |
| විභාග සහ ඇගයීම් | 25,689,326.80 | |
| ප්‍රසාද දීමනා | 423,800.00 | |
| නෛතික ගාස්තු | 485,500.00 | |
| විවිධ වියදම් | 4,970,583.80 | |
| තත්ව කළමනාකරණය සහ ප්‍රතීතනය | 3,059,385.30 | |
| වාර ප්‍රවේශ පත්‍ර | 1,745,422.86 | |
| විශේෂ පුහුණු වැඩසටහන | 57,000.00 | |
| වැටුප් දීමනා | 57,500.00 | |
| ආවුද සහ පර්යේෂණ ද්‍රව්‍ය | 770,904.00 | |
| පුහුණුව අධීක්ෂණය | 1,500.00 | |
| **විශේෂ ව්‍යාපෘති සඳහා වියදම** | | |
| නිපුණතා සිසු සවිය සඳහා වියදම | 81,674,000.00 | |
| SSDP සඳහා වියදම | 115,496,742.48 | |
| මුස්ලිම් ආධාර සඳහා වියදම | | |
| අමාත්‍යාංශය සඳහා වියදම | 127,138.56 | |
| මුල් ළමාවිය සංවර්ධනය සඳහා වියදම | | |
| මහවැලි අධිකාරිය සඳහා වියදම | | |
| **මූල්‍ය පිරිවැය** | | |
| බැංකු අය කිරීම් | 132,511.90 | |
| පුහුණු ද්‍රව්‍ය | 81,979,378.69 | |
| කාර්ය මණ්ඩල පුහුණුව - ධාරිතා සංවර්ධනය | 4,175,124.67 | |
| ප්‍රවර්ධන වියදම් | 14,878,627.07 | |
| වෘත්තීය මාර්ගෝපදේශනය | 1,943,660.73 | |
| ක්ෂය වීම් | 539,764,710.83 | |
| මූල්‍ය ලීසිං සඳහා පොලී | 2,365,180.00 | |
| කල්බදු ක්‍රමය යටතේ වාහන බද්දට / කුලියට දීම | 4,276,540.80 | |
| ලාභ /පාඩු ගිණුම් | 991,200,526.21 | |
| පෙර වසරේ ගැලපීම් | | 1,778,633.34 |
| අනුමත හැරයාම් | 484,300.00 | |
| **මුළු එකතුව** | **14,328,757,833.70** | **14,328,757,833.70** |

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | VOT/D/VTA/1/2021/19 | ඔබේ අංකය / உமது இல. / Your No. | |
| දිනය / திகதி / Date | 2022 ජූනි 30 දින | | |

සභාපති

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කල මතය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම
---

(අ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සම්පූර්ණ (100%) කොටස් අයිතිය සහිතව 2013 දෙසැම්බර් 18 දින වී.ටී.ඒ. හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලියාපදිංචි කර තිබුණි. එහෙත් 2013 දෙසැම්බර් 18 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වාම අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අධිකාරිය විසින් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 48 ඡේදය අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත මඟින් අවසර දී ඇති විටෙක හැර ආදායමට වියදම් හිලව් නොකල යුතු වුවත් ආදායම් අයිතම 05 කට අදාලව එකතුව රු. 53,382,820 ක් වූ ආදායමෙන් එකතුව රු. 23,917,086 ක වියදම් හිලව් කර ශුද්ධ ආදායම වූ රු. 29,465,734 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 14 වගන්තිය අනුව අධිකාරියට අයත් ඉඩම් 29 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතමවල සාධාරණ වටිනාකම සෑම වර්ෂ 03 කට හෝ 05 කට වරක් ප්‍රත්‍යාගණනය කලයුතු වුවත් අධිකාරිය සතු ඉඩම් හා ගොඩනැගිලි 2008 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු රු. 240,467,473 ක භාණ්ඩාගාර හා අනෙකුත් රාජ්‍ය ප්‍රදාන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීම හා මැනීම සිදුකර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 12 අනුව සින්නක්කර ඉඩම් හා බදු ඉඩම්, මූල්‍ය ප්‍රකාශනවල වෙන්කර දක්වා නොතිබුණු අතර එකතුව රු. 9,842,565 ක් වූ කල්බදු ඉඩම් 05 ක් සම්බන්ධයෙන් යොමුගත ප්‍රමිතය පරිදි ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2018 වර්ෂයේදී මිලදීගත් වත්කම් පංති 03 කට අදාලව එකතුව රු. 25,775,505 ක් වූ වත්කම් සඳහා ක්ෂය ද්විගණනය වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය රු. 2,943,759 ක් හා 2019 හා 2020 වර්ෂයන්ට අදාල ක්ෂය රු. 9,221,628 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. ඒ හේතුවෙන් වර්ෂයේ ඌනතාවය රු. 2,943,759 කින් හා සමුච්චිත අරමුදලේ හර ශේෂය රු. 9,221,628 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණිත අගය රු. 198,889,054 ක් වූ වත්කම් රජයේ ප්‍රාග්ධන ප්‍රදාන යටතේ මිලදීගෙන සම්පූර්ණයෙන් ක්ෂය කර හා විලම්භිත ආදායම් ලෙස කපාහැර අවසන් වී තිබියදී එම වත්කම් ප්‍රත්‍යාගණිත වටිනාකම මත ක්ෂය කිරීමේදී ඊට සමාන ප්‍රමාණයක්

2

තවදුරටත් විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයට අදාල අලාභය රු. 18,780,149 කින් හා සමුච්චිත අරමුදලේ හර ශේෂය රු. 76,820,627 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය තුල ඉවත්කරන ලද වත්කම් වලට අදාල පිරිවැය හා සමුච්චිත ක්ෂය අදාල ගිණුම්වලින් ඉවත් කර වත්කම් ඉවත්කිරීමෙන් ලද ලාභය හදුනා ගැනීමකින් තොරව එම වත්කම් විකිණීමෙන් ලැබී තිබුණු රු: 2,030,410 ක මුදල වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඒ) 2018 දෙසැම්බර් 31 දිනට ශුද්ධ අගය රු.4,496,902 ක් වූ මෝටර් රථ 24 ක්, එම වර්ෂයේදී සිදුකර තිබුණු ප්‍රත්‍යාගණනයේදී අත්හැරී තිබුණද එය නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී ද තවයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

3

1.4 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක

4

කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව,

5

විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි

.2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති අංක (අ), (ආ), (ඈ), (ඊ) හා (ඒ) ඡේද හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ | |
| i. මුදල් රෙගුලාසි 04 වන උපලේඛනයේ 288 පොදු ආකෘතිය | අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට ශුද්ධ අගය රු.7,971,202,923 ක් වූ දේපල පිරියත උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

6

(31)

| | |
|---|---|
| ii. මුදල් රෙගුලාසි 1646 | ධාවනය කරනු ලබන සංචිත වාහනවල ධාවන සටහන් ඊළඟ මාසයේ 15 වන දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවද සංචිත වාහන 123 කට අදාල 2019 ජනවාරි මාසයේ සිට 2021 දෙසැම්බර් දක්වා කාලපරිච්චේදය වෙනුවෙන් දෛනික ධාවන සටහන් 2022 මාර්තු 31 දින දක්වාම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එම සියළු වාහනවල ඉන්ධන සඳහා අදාල කාලපරිච්ඡේදය වෙනුවෙන් රු. 28,280,105 ක් වැය කර තිබුණි. |
| (ආ) 2017 ඔක්තෝබර් 25 දිනැති අංක 05/ 2017 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතියෙන් මූලික වැටුපෙන් 1/3 දීමනා ලබාගන්නා නිලධාරීන් 08 දෙනෙක් වෙනුවෙන් චක්‍රලේඛයට පටහැනි ලෙස 2017 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා රු. 1,669,516 ක් ගෙවීම් කර තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 03/2003 හා 05/2013 දරන අභ්‍යන්තර චක්‍රලේඛය | අධිකාරියේ එක් එක් නිලධාරියෙකු එක් දිස්ත්‍රික්කයක රාජකාරී කලයුතු උපරිම සේවා කාලය වසර 06 ක් පමණක් වුවත් ඒ අනුව වසර 06 කට වඩා සේවා කාලයක් සහිත නිලධාරීන් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ වලට යටත්ව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.2** වෙනත් කරුණු
--------------------

(අ) 2006 වර්ෂයේ සිට 2015 මැයි මාසය දක්වා සේවක භාරකාර අරමුදල් දායකය ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් 2019 වර්ෂයේදී ගෙවීමට සිදු වී තිබුණු රු. 7,898,073 ක අධිභාර මුදල් එයට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය හා ගම්පහ කාර්මික විද්‍යාලය ඉදිකිරීමේ කොරියානු ණය ව්‍යාපෘතියෙන් 2019 වර්ෂයේදී අධිකාරිය යටතේ පවතින ඔරුගොඩවත්ත කොරියන් ටෙක්

7

ආයතනය වෙත ලබාදී තිබුණු එකතුව රු. 15,743,838 ක උපකරණ 157 ක් කිසිදු ප්‍රයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවතුණු අතර එකතුව රු. 1,784,794 ක් වටිනා උපකරණ 07 ක් අක්‍රීය වී පැවතුණි. එසේම එම ආයතනයට වෛද්‍ය හෝ හෙද තනතුරු අනුමත වී නොතිබියදී රු. 3,500,000 ක වටිනාකමැති වෛද්‍යවරුන් විසින් භාවිතයට ගනු ලබන වෛද්‍ය උපකරණ හා ඖෂධ ලබාදී තිබූ අතර එම ඖෂධ වර්ග භාවිතයකින් තොරව කල් ඉකුත් වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

8

**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ පිළිතුරු වාර්තාව**

**1.2**

(අ) මෙම සමාගම ඈවර කිරීම සඳහා 2022.06.20 වන දින සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තුමේන්තුව වෙත භාර දී ඇත.

(ආ) මෙම ආදායම් අයිතම 05ට අදාලව අදායම් හා වියදම් වෙන වෙනම ලෙජර් ගිණුම් වල පෙන්නුම් කරන අතර එය මූල්‍ය ප්‍රකාශනය තුල ශුද්ධ ආදායම් පමණක් පෙන්නුම් කර ඇත. 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම ආදායම් හා වියදම් වෙන වෙනම දැක්වීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සඳහා පවරන ලද හා මිලදී ගන්නා ලද ඉඩම් 29ක් සම්බන්ධයෙන් වටිනාකම් එකවර තක්සේරු කරන ලෙස ඉල්ලා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත තොරතුරු ඉදිරිපත් කර ඇත.ඒ අනුව ඊට ප්‍රතිචාර දක්වමින් 2022.06.21 වන විට තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉඩම් 17 ක් සම්බන්ධයෙන් තක්සේරු වාර්තා ලබා දී ඇත.

(ඈ) මේ වන විට ඉඩම් ගොඩනැගිලි තක්සේරු දෙපාර්තමේන්තුව තක්සේරු කරමින් පවතින අතර එම කටයුතු අවසන් වූ පසු ගිණුම් වල ගැලපීම් සිදු කරනු ඇත.

(ඉ) භාණ්ඩාගාරයෙන් හා අනෙකුත් රාජ්‍ය ප්‍රධානයන් ලෙස ලැබී තිබුණ ප්‍රාග්ධන ප්‍රධානයන් සියල්ලම මූල්‍ය ප්‍රමිතවල පෙර වර්ෂ වල පරිදි 2021 වර්ෂයේදී ගිණුම් ගත කර ඇති නමුත් ගිණුම්කරණ ප්‍රමිත 11හි සංශෝධනයන්ට අනුව 2022 වර්ෂයේදි නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත.

(ඊ) විමසුමේ සඳහන් පරිදි අධිකාරිය විසින් කල්බදු ක්‍රමයට ඉඩම් ලබාගැනීමේදී යටියන්තොට ඉඩමට අදාලව පමණක් රු.9000ක බදු කුලියක් ගෙවන අතර අනෙකුත් ඉඩම් 04 සඳහා බදු කුලියක් ගෙවනු නොලබයි. ඒ අනුව ප්‍රමිත අංක 12 යටතේ යටියන්තොට ඉඩම සඳහා පමණක් ක්‍රමක්ෂය කිරීම 2022 වර්ෂයේදී ගිණුම් පිළියෙළ කිරීමේදී සිදුකරනු ලබයි.

(උ) මේ සඳහා අදාල ගැලපීම් 2022 අවසන් ගිණුම් පිළියෙළ කිරීමේදී සිදු කරනු ලැබේ.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 13 අනුව වත්කම් නැවත අගය කිරීමේදී පදනම් 02ක් සළකා බලයි. එනම් වෙළඳපල පිරිවැය සහ මිල පිරිවැයයි. ඒ අනුව අදාළ වත්කම් මිල දී ගත් වර්ෂය හෝ පිරිවැය නොදන්නේ නම් ඉහත වෙළඳපල පිරිවැය අනුගමනය කරයි. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 1996 වර්ෂයේ සිට වත්කම් සහ කම්කරු දෙපාර්තුමේන්තුවෙන් පවරා ගත් වත්කම් තිබෙන බැවින් එහිදී මිලදී ගත් කාල සීමාව සඳහන් කිරීම අපහසුය. ඒ අනුව ඉහත තත්වය අනුගමනය කර ඇත. එම නිසා විමසුමේ පරිදි තක්සේරු කිරීම ප්‍රායෝගිකව අපහසු වී ඇත.

(එ) මේ වන තෙක් ආයතනය මඟින් වත්කම් විකිණීමේදී අදාළ වත්කම වෙන වෙනම හඳුනා ගැනීමක් සිදු කර නොමැති අතර විකිණීමෙන් ලද මුදල් වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කර ඇත. 2022 වර්ෂයේ සිට නිවැරදිව වත්කම් හඳුනාගෙන වෙන්දේසි කිරීමට කටයුතු කරනු ඇත.

(ඒ) මෝටර් වාහන දෙපාර්තමේන්තුව විසින් මේ වන විට මෝටර් වාහන 16ක ලියාපදිංචි සහතික (පොත්) පරීක්ෂා කර ඇත. එම වාහන භෞතිකව පරීක්ෂා කර වැසි අංකය ඉවත් කිරීම සඳහා මෝටර් වාහන දෙපාර්තමේන්තුවේ නිලධාරියකු පත් කර ඇත. අදාළ කාර්ය නිම වීමෙන් පසු ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කරනු ඇත.

2.2.2

(අ)

i. ස්ථාවර වත්කම් ලේඛණය සැකසීම සඳහා සකස් කරන ලද මෘදුකාංගයෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා යාවත්කාලීන කිරීම සිදු කළ යුතුය. එම යාවත්කාලීන කටයුතු සිදු කරමින් පවතී.

ii. 2022 වර්ෂයේ සිට විධිමත් පරිදි ධාවන සටහන් ගෙන්වා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. මේ වන විට 2022.05.31 දින තෙක් ලැබී ඇති ධාවන සටහන් 2022.06.27 වන දින විගණන අංශය වෙත යොමු කර ඇත.

මෙතෙක් ලැබී නොමැති ධාවන සටහන් කඩිනමින් ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

(ආ) අර්ධකාලීන පදනම මත සම්බන්ධීකාරක නිලධාරීන් ලෙස සේවයේ යොදවා ඇති මෙම නිලධාරීන්ට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2017 අනුව ගෙවීම් සිදු කිරීම නැවත සළකා බලා පැහැදිලි කර දෙන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියකින් දැනුම් දී ඇත.

සභාපතිතුමාගේ සටහන අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේනතුවෙන් අදාළ උපදෙස් ලැබෙන තෙක් වැටුපෙන් අයකර ගැනීම තාවකාලිකව අත්හිටුවීමට අධ්‍යක්ෂ (මුදල්) වෙත දැනුම් දී ඇත.

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂ මණ්ඩළ පත්‍රිකාවක් ඉදිරිපත් කළද මේ සඳහා ඇතැම් නිලධාරීන්ගේ මානුෂීය ඉල්ලීම් ඇතිවිය හැකි බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ සඳහා සියළුම අංශ නියෝජනය වන පරිදි කමිටුවක් පත් කර නිර්දේශ යෝජනා කරන ලෙස දැනුම් දී ඇත. එබැවින් නැවත එම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව යොමු කළ යුතු ය.

2.2

(ආ) 2006 වර්ෂයේ සිට 2015 මැයි මාසය දක්වා කාලයට අදාලව ජීවන වියදම් දීමනාව පදනම් කරගෙන සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගණනය කර ගෙවීම් කිරීමේදී සේවක භාරකාර අරමුදලෙන් අධිභාරයක් අයකරගෙන ඇත. එම අධිභාරය නොගෙවුවහොත් සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල අප ආයතනයට විරුද්ධව නීතී මගින් කටයුතු කරන බවට දැනුම් දීමෙන් පසු අධ්‍යක්ෂක මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන මෙම ගෙවීම සිදු කර ඇත. එම තත්වය නොසැලකිල්ලෙන් සිදුවූවක් නොවන අතර මෙම දීමනාව අන්තර් දීමනාවක් ලෙස වැරදි ලෙස අර්ථ නිරූපණය කර ගැනීමෙන් මෙම තත්වය උද්ගත වී ඇත.

(ආ) අදාළ උපකරණ ඒ ඒ ස්ථාන වල විධිමත් පරිදි ස්ථානගත කිරීමට කටයුතු කර ඇත. අක්‍රීයව පැවති උපකරණ 07 මේ වන විට ශ්‍රී ලංකාවේ නියෝජිත ආයතනයක් වෙත දන්වා අලුත්වැඩියා කර ඇති අතර බෙහෙත් වර්ග වෛද්‍ය නිර්දේශ නොමැතිව භාවිතයට ගත නොහැකි අතර තුවාල වීම්, තැලීම් සඳහා භාවිතයට ගත හැකි ද්‍රව්‍ය පමණක් භාවිතයට ගැනීමට කටයුතු කර ඇත.

එරංග බස්නායක
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.